සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026**
**General Certificate of Education (Adv. Level) Examination, 2026**

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

**33 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- ※ අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- ※ සෑම ප්‍රශ්නයකට ම **සමාන** ලකුණු හිමි වේ.
- ※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ※ **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

**විභාග අංකය :** ..................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති.ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික පරමාර්ථය **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?

(1) කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා ආයතනයේ අතීත ගනුදෙනු මත පදනම්ව මූල්‍ය තොරතුරු සැපයීම.
(2) ආයතනයේ අභ්‍යන්තර ඇල්මැති පාර්ශ්වයන්ට ආර්ථික තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු සැපයීම.
(3) ආයෝජකයන්ට, ණය සැපයුම්කරුවන්ට සහ අනිකුත් ණයහිමියන්ට ආර්ථික තීරණ ගැනීම සඳහා ඉල්ලූ විට ආයතනය පිළිබඳ මූල්‍ය තොරතුරු සැපයීම.
(4) ආයතනයේ බාහිර ඇල්මැති පාර්ශ්වයන්ට ආර්ථික තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු සැපයීම.
(5) ආදායම් බදු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ආයතනය පිළිබඳ මූල්‍ය තොරතුරු සැපයීම.

(......)

**2.** ආයතනයක තොගය, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ආගණනය කිරීමේ පදනම පැහැදිලි කිරීමට පහත කුමන ගිණුම්කරණ සංකල්පය **වඩාත්** උචිත වේ ද?

(1) උපචිත
(2) ඓතිහාසික පිරිවැය
(3) ගැළපුම්
(4) විචක්ෂණ
(5) උපලබ්ධි

(......)

**3.** ආයතනයක ගිණුම්කරණ සංකල්ප භාවිත කිරීමට අදාළව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - කලින් ගෙවන ලද ගෙවල් කුලිය එය දරනු ලබන කාලච්ඡේදයේදී වියදමක් ලෙස හඳුනාගනු ලබන්නේ උපචිත සහ ගැළපුම් සංකල්පවලට අනුකූලව ය.

B - ආයතනය විසින් ගෙවන ලද අයිතිකරුගේ පෞද්ගලික විදුලි බිල ආයතනයේ පොත්වල ගැනිලි ලෙස සටහන් කරනු ලබන්නේ විචක්ෂණ සහ උපචිත සංකල්පවලට අනුකූලව ය.

C - ආයතනයේ කටයුතු තුළින් ඇතිවන පරිසර දූෂණයේ බලපෑම එහි මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු නොලබන්නේ ව්‍යාපාර ඒකක සහ මූල්‍ය මිනුම් සංකල්පවලට අනුකූලව ය.

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම ය.

(......)

Past Papers Wiki



**4.** මුදලින් රු. මිලියන 15 ක් ද රු. මිලියන 10 ක් වටිනා මෝටර් රථයක් ද ආයෝජනය කරමින් 2025.01.01 දින මධු ට්‍රේඩර්ස් විසින් දේපළ වෙළෙඳාම් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෝටර් රථය වසර 5 ක කාලයක් තුළ ක්ෂය කරනු ලබයි. ව්‍යාපාරය විසින් නැවත විකිණීමේ පරමාර්ථයෙන් පිරිවැය රු. මිලියන 12 ක් වූ ඉඩම් ණයට මිල දී ගන්නා ලදී. එයින් පිරිවැය රු. මිලියන 2 ක් වූ ඉඩමක් රු. මිලියන 3 කට ණයට විකුණන ලදී. තවද, පිරිවැය රු. මිලියන 4 ක් වූ ඉඩමක් ව්‍යාපාරයේ පරිපාලන කටයුතු සඳහා භාවිත කරන ලදී.

2025.12.31 දිනට මෙම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | **ජංගම නොවන වත්කම්** (රු.'මිලියන) | + | **ජංගම වත්කම්** (රු.'මිලියන) | = | **වගකීම්** (රු.'මිලියන) | + | **හිමිකම** (රු.'මිලියන) |
|---|---|---|---|---|---|---|---|
| (1) | 8 | | 28 | | 12 | | 24 |
| (2) | 12 | | 24 | | 12 | | 24 |
| (3) | 14 | | 24 | | 12 | | 26 |
| (4) | 20 | | 16 | | 12 | | 24 |
| (5) | 21 | | 15 | | 12 | | 24 |

(……)

- **අංක 5, 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් වන කුමාර ට්‍රේඩර්ස් විසින් එහි මෙහෙයුම් කටයුතු 2026.01.01 දින ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අතර එහි සියලු මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් මගින් සිදු කරනු ලබයි. 2026 ජනවාරි මාසය තුළදී භාණ්ඩ ගැනුම් සහ විකුණුම්වලට අදාළව පහත ගනුදෙනු සිදු වී ඇත.

**1.** සමන් ට්‍රේඩර්ස් වෙතින් රු.767 000 ක් වූ භාණ්ඩ ණයට මිල දී ගැනීම (රු. 117 000 ක VAT ඇතුළත්ව).
**2.** පිරිවැය රු. 200 000 ක් වූ භාණ්ඩ රු. 295 000 කට අත්පිට මුදලට විකිණීම (රු. 45 000 ක VAT ඇතුළත්ව).
**3.** පිරිවැය රු. 400 000 ක් වූ භාණ්ඩ රු. 590 000 කට අමිත ට්‍රේඩර්ස්ට ණයට විකිණීම (රු. 90 000 ක VAT ඇතුළත්ව).
**4.** අමිත ට්‍රේඩර්ස්ට රු. 59 000 කට විකුණූ භාණ්ඩ ආපසු එවීම (රු. 9 000 ක VAT ඇතුළත්ව). මෙම භාණ්ඩවල පිරිවැය රු. 40 000 ක් විය.

**5.** කුමාර ට්‍රේඩර්ස්හි මූලික සටහන් පොත්වල ඉහත ගනුදෙනු **2, 3** සහ **4** සටහන් කිරීමට භාවිත කරන මූලාශ්‍ර ලේඛන පිළිවෙළින්:

(1) ලදුපත, ඉන්වොයිසිය, බැරපත
(2) ලදුපත, ඉන්වොයිසිය, හරපත
(3) තැන්පතු තුණ්ඩුව, ඉන්වොයිසිය, බැරපත
(4) තැන්පතු තුණ්ඩුව, ඉන්වොයිසිය, හරපත
(5) ලදුපත, ඉන්වොයිසිය, ජර්නල් වවුචරය

(……)

**6.** 2026 ජනවාරි මාසය සඳහා කුමාර ට්‍රේඩර්ස්හි විකුණුම් ජර්නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීමේ **නිවැරදි** ද්විත්ව සටහන:

| | **විස්තරය** | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|---|
| (1) | වෙළෙඳ ණයගැති පාලන ගිණුම | 531 | |
| | විකුණුම් ගිණුම | | 450 |
| | VAT පාලන ගිණුම | | 81 |
| (2) | වෙළෙඳ ණයගැති පාලන ගිණුම | 500 | |
| | VAT පාලන ගිණුම | 90 | |
| | විකුණුම් ගිණුම | | 590 |
| (3) | වෙළෙඳ ණයගැති පාලන ගිණුම | 590 | |
| | විකුණුම් ගිණුම | | 500 |
| | VAT පාලන ගිණුම | | 90 |
| (4) | වෙළෙඳ ණයගැති පාලන ගිණුම | 750 | |
| | VAT පාලන ගිණුම | 135 | |
| | විකුණුම් ගිණුම | | 885 |
| (5) | වෙළෙඳ ණයගැති පාලන ගිණුම | 885 | |
| | විකුණුම් ගිණුම | | 750 |
| | VAT පාලන ගිණුම | | 135 |

(……)

**7.** 2026.01.31 දිනට VAT පාලන ගිණුමේ ශේෂය සහ 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා දළ ලාභය:

| | **VAT පාලන ගිණුමේ ශේෂය (රු.'000)** | **දළ ලාභය (රු.'000)** |
|---|---|---|
| (1) | හර 9 | 140 |
| (2) | හර 18 | 150 |
| (3) | බැර 9 | 140 |
| (4) | බැර 9 | 150 |
| (5) | බැර 18 | 140 |

(……)

0700035

- **අංක 8, සහ 9 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ව්‍යාපාරයක් විසින් එහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් තුළින් සිදු කරනු ලබයි. 2026.03.01 දින මුදල් ගිණුමේ ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ විය. 2026.03.31 දිනට මුදල් ගිණුමේ හර ශේෂය රු. 300 000 ක් වූ අතර එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟ එකඟ නොවී ය. 2026.04.04 දින ලද බැංකු ප්‍රකාශනය පරීක්ෂා කළ විට මෙම වෙනසට හේතු ලෙස පහත දෑ හඳුනාගන්නා ලදී.

**A** - 2026.03.31 දින තැන්පත් කළ රු. 200 000 ක චෙක්පතක් 2026.04.02 දින උපලබ්ධි වී තිබුණි.

**B** - 2026.03.31 දින ණයගැතියෙකු විසින් රු. 100 000 ක් බැංකුවට සෘජුව ප්‍රේෂණය කර තිබුණි.

**C** - 2026.03.31 දින බැංකුව විසින් ණය වාරිකයක් සඳහා රු. 60 000 ක ස්ථාවර නියෝග ගෙවීමක් සිදු කර තිබුණි. (මෙම ගෙවීම තුළ රු. 15 000 ක පොලී වියදමක්ද ඇතුළත් වේ.)

**D** - 2026.03.30 දින ණයහිමියෙකුට නිකුත් කරන ලද රු. 150 000 ක චෙක්පතක් 2026.04.03 දින ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබුණි.

ව්‍යාපාරයේ ණයගැතියන් දෙදෙනෙකුගෙන් ශේෂ පියවීම සඳහා ලද මුදල් ඉහත **A** සහ **B** මඟින් නිරූපණය කරයි. තවද, සෘජු ප්‍රේෂණ සහ ස්ථාවර නියෝග මත ගෙවීම් මුදල් ගිණුමේ ගළපනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව ය.

**8.** 2026.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය:

| | බැංකු ප්‍රකාශනයේ ශේෂය (රු.'000) | මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය (රු.'000) |
|---|---|---|
| (1) | 250 | 290 |
| (2) | 290 | 340 |
| (3) | 290 | 355 |
| (4) | 390 | 340 |
| (5) | 390 | 355 |

(......)

**9.** බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව මුදල් ගිණුමට කරන ලද ගැළපීම් හේතුවෙන් 2026.03.31 දිනට ව්‍යාපාරයේ ණයගැති පාලන ගිණුමේ ශේෂයේ සහ මුළු වගකීම්වල **අඩුවීම**:

| | ණයගැති පාලන ගිණුමේ ශේෂයේ අඩුවීම (රු.'000) | මුළු වගකීම්වල අඩුවීම (රු.'000) |
|---|---|---|
| (1) | 100 | 45 |
| (2) | 100 | 60 |
| (3) | 100 | 195 |
| (4) | 300 | 45 |
| (5) | 300 | 60 |

(......)

**10.** තනි පුද්ගල ව්‍යාපාරයක් වන මායා ට්‍රේඩර්ස් විසින් 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 450 000 ක දළ ලාභයක් සහ රු. 280 000 ක ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී. වර්ෂය තුළදී පිරිවැය රු. 25 000 ක් වූ භාණ්ඩ ගින්නක් හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණ අතර මෙය ගිණුම් පොත්වල ගළපා නොතිබුණි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා 2026.03.31 දිනට තොගයේ පිරිවැය රු. 40 000 ක් ලෙස එදිනට පැවති භෞතික තොගය මත නිවැරදිව ආගණනය කරන ලදී. එදිනට මෙම අවසාන තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 35 000 ක් වූ අතර මේ සඳහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැළපීමක් සිදුකර නොතිබුණි.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** දළ ලාභය සහ ශුද්ධ ලාභය:

| | දළ ලාභය (රු.'000) | ශුද්ධ ලාභය (රු.'000) |
|---|---|---|
| (1) | 425 | 275 |
| (2) | 470 | 240 |
| (3) | 475 | 250 |
| (4) | 475 | 275 |
| (5) | 480 | 275 |

(......)

PAST PAPERS WIKI

02030001580110035

Past Papers Wiki



**11.** 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයක් විසින් පහත තොරතුරු වාර්තා කර ඇත.

| | රු.'000 |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | 490 |
| මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 160 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 850 |
| 2025.04.01 දිනට නිමි භාණ්ඩ තොගය | 100 |
| 2026.03.31 දිනට නිමි භාණ්ඩ තොගය | 140 |
| විකුණුම් | 1 500 |

නොනිමි තොගය මුළු නිෂ්පාදන පිරිවැයට ගළපනු ලබයි.

2025.04.01 දිනට පැවති නොනිමි තොගයට සාපේක්ෂව 2026.03.31 දිනට නොනිමි තොගයේ **අඩුවීම** සහ දළ ලාභ අනුපාතය:

| | **නොනිමි තොගයේ අඩුවීම (රු.'000)** | **දළ ලාභ අනුපාතය (%)** |
|---|---|---|
| (1) | 200 | 43 |
| (2) | 200 | 46 |
| (3) | 360 | 43 |
| (4) | 360 | 46 |
| (5) | 400 | 46 |

(……)

**12.** තනි පුද්ගල ව්‍යාපාරයක් වන ඉරේෂා එන්ටර්ප්‍රයිසස්, ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වා නොගනී. 2026.03.31 දිනට සහ 2025.03.31 දිනට පැවති තොග සහ වෙළෙඳ ණයගැති ශේෂයන් පහත දී ඇත.

| | **2026.03.31 දිනට (රු.)** | **2025.03.31 දිනට (රු.)** |
|---|---|---|
| තොගය | 60 000 | 40 000 |
| වෙළෙඳ ණයගැතියෝ | 130 000 | 90 000 |

**අතිරේක තොරතුරු:**

- සියලු ගැනුම් සහ විකුණුම් ණය පදනමට සිදු කරනු ලබයි.
- 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වෙළෙඳ ණයගැතියන්ගෙන් ලද මුළු මුදල රු. 570 000 ක් විය.
- ආයතනය විසින් 25% ක දළ ලාභ අනුපාතයක් පවත්වා ගැනේ.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් සහ ගැනුම්:

| | **විකුණුම් (රු.)** | **ගැනුම් (රු.)** |
|---|---|---|
| (1) | 530 000 | 377 500 |
| (2) | 530 000 | 417 500 |
| (3) | 570 000 | 447 500 |
| (4) | 610 000 | 447 500 |
| (5) | 610 000 | 477 500 |

(……)

**13.** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 42 වන වගන්තියට අනුව පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?

(1) හවුල් ව්‍යාපාරයට ලබාදුන් ණය මුදලක් මත 5% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවෙකු හිමිකම් ලබයි.
(2) නව හවුල්කරුවෙකු බඳවාගත හැක්කේ දැනට සිටින හවුල්කරුවන් සංඛ්‍යාව 20 කට වඩා අඩු නම් පමණි.
(3) කළමනාකරණයට සහභාගි වීම වෙනුවෙන් වේතනයක් ලැබීමට හවුල්කරුවෙකු හිමිකම් නොලබයි.
(4) විශ්‍රාම යන හවුල්කරුවෙකු ලාභ බෙදාගැනීමේ අනුපාතයට අනුව හවුල් ව්‍යාපාරයේ කීර්තිනාම කොටසකට හිමිකම් ලබයි.
(5) විශ්‍රාම යන හවුල්කරුවෙකුගේ නොපියවන ලද හිමිකම් ශේෂයට 5% ක අවම වාර්ෂික පොලියක් ලැබීමට එම හවුල්කරු හිමිකම් ලබයි. (……)

**14.** හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ලිඛිත, වාචික හෝ හැඟවීමෙන් එකඟතාවයක් නොමැති විට 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - හවුල් ව්‍යාපාරයට දායක වී ඇති ප්‍රාග්ධනය මත පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.
B - හවුල් ව්‍යාපාරයේ කළමනාකාරිත්වයට සහභාගි වීම වෙනුවෙන් වේතනයක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.
C - හවුල් ව්‍යාපාරයේ ලාභ සහ අලාභ සම සමව ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.
D - හවුල් ව්‍යාපාරයට ලබා දී ඇති ණය මුදලක් මත 5% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.

(1) A හා C පමණි. (2) B හා D පමණි. (3) C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (……)

**15.** පහත තොරතුරු සමන් සහ විදුර හවුල් ව්‍යාපාරයට අදාළ වේ.

| | සමන් (රු.'000) | විදුර (රු.'000) |
|---|---|---|
| 2026.03.31 දිනට ප්‍රාග්ධන ශේෂය | 5 000 | 3 000 |
| ප්‍රාග්ධනය මත පොලිය (වර්ෂය අග ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලිය) | ? | ? |
| වාර්ෂික වේතන | 1 200 | 800 |
| ලාභ කොටස් (සමන් සහ විදුර අතර 3:2 ලාභ අනුපාතයට) | ? | ? |

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 7 000 000 ක ලාභයක් හවුල් ව්‍යාපාරය වාර්තා කරන ලදී.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමන්ගේ ලාභ කොටස සහ විදුරට විසර්ජනය කළ මුළු ලාභය පිළිවෙළින්:

| | සමන් (රු.'000) | විදුර (රු.'000) |
|---|---|---|
| (1) | 2 520 | 1 680 |
| (2) | 2 520 | 2 780 |
| (3) | 4 200 | 2 800 |
| (4) | 4 220 | 1 680 |
| (5) | 4 220 | 2 780 |

(……)

- **අංක 16, සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත හිරුක පොදු සමාගමේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| දළ ලාභය | 16 000 |
| වෙනත් ආදායම් | 1 500 |
| මෙහෙයුම් වියදම් | 7 500 |
| මූල්‍ය වියදම් | 1 000 |
| ආදායම් බදු වියදම | 1 200 |

**අතිරේක තොරතුරු:**

ගොඩනැගිලි සහ යන්ත්‍ර යන දෙකම 2026.03.31 දින දෙවන වරටත් 2025.03.31 දින ප්‍රථම වරටත් ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙම ප්‍රත්‍යාගණන හේතුවෙන් පහත අතිරික්ත සහ ඌනතාවයන් ඇති විය.

| | අතිරික්තය / (ඌනතාවය) 2026.03.31 දිනට (රු.'000) | අතිරික්තය / (ඌනතාවය) 2025.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| ගොඩනැගිලි | (1 500) | 1 000 |
| යන්ත්‍ර | 1 200 | (2 000) |

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන හිඟය වූ රු. 1 500 000 ක් මෙහෙයුම් වියදම් තුළත් යන්ත්‍රවල ප්‍රත්‍යාගණන අතිරික්තය වූ රු. 1 200 000 ක් වෙනත් ආදායම් තුළත් ඇතුළත් කර ඇත.

**16.** 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** වෙනත් විස්තීරණ ආදායම (රු.'000):
(1) (1 000) (2) (500) (3) (300) (4) 200 (5) 1 200 (……)

**17.** 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** ලාභය (රු.'000):
(1) 6 600 (2) 7 800 (3) 8 300 (4) 8 800 (5) 9 300 (……)

**18.** 'LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි' ප්‍රමිතයට අනුව, පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - මිනුම් කිරීමේ අවිනිශ්චිතතාවයන්ට භාජනය වන මූල්‍ය ප්‍රකාශනවල ඇති මූල්‍යමය වටිනාකම් ගිණුම්කරණ ඇස්තමේන්තු වේ.

B - ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස් වීමක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රවර්තන කාලච්ඡේදයේ සහ අතීතානුයෝගීව අදාළ පෙර කාලච්ඡේදවල ගළපනු ලබයි.

C - මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග හඳුනාගැනීම, මිනුම් කිරීම, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීමට අදාළව වැරදි ඇති විය හැකි ය.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (……)

**19.** 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අකිල පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2026.06.30 දින අධ්‍යක්ෂවරුන් විසින් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.
'LKAS 10 - වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්' ප්‍රමිතයට අනුව මෙම සමාගමේ පහත කුමන සිදුවීම් 'ගළපන සිදුවීම්' ලෙස සැලකිය හැකි ද?

A - 2026.03.31 දිනට රු. මිලියන 50 කට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කළ කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් 2026.04.18 දින ඇති වූ ගින්නක් හේතුවෙන් විනාශ විය.

B - 2026.03.31 දිනට රු. 800 000 ක ශේෂයක් සහිත ණයගැතියෙකු බුන්වත් වූ බව 2026.05.25 දින ප්‍රකාශයට පත් කරන ලදී.

C - සමාගමේ විකුණුම් 2026 අප්‍රේල් සහ මැයි මාස වලදී රු. 5 000 000 කින් අඩු වී ඇත.

D - ප්‍රවර්තන වර්ෂය තුළදී අත්පත් කරගත් පිරිවැය රු. 1 500 000 ක් වූ වත්කමක් පොත්වල සටහන් කර නොතිබුණි. 2026.06.15 දින සිදු කරන ලද විමර්ශනයකදී මේ බව අනාවරණය කරගන්නා ලදී.

(1) A හා B පමණි. (2) B හා D පමණි. (3) A, B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) B, C හා D පමණි. (……)

**20.** ගුණාත්මකභාවයෙන් අඩු අමුද්‍රව්‍යයක් සැපයීම වෙනුවෙන් රු. 5 000 000 ක වන්දියක් ඉල්ලමින් 2026.03.31 න් අවසන් වර්ෂය තුළදී සීමිත මෙහෙලි පොදු සමාගම සැපයුම්කරුවෙකුට එරෙහිව නඩුවක් පවරන ලදී. සීමිත මෙහෙලි පොදු සමාගමේ නීතිඥවරයාගේ මතයට අනුව මෙම නඩුවේ ප්‍රතිඵලය සමාගමට වාසිදායක වීමේ ඉහළ සම්භාවිතාවක් පවතී. 'LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්' ප්‍රමිතයට අනුව සීමිත මෙහෙලි පොදු සමාගමේ 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල මෙම නඩුව සඳහා **නිවැරදි** ගිණුම්කරණ පිළිවෙත:

(1) රු. 5 000 000 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු ය.
(2) රු. 5 000 000 ක අසම්භාව්‍ය වගකීමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු ය.
(3) රු. 5 000 000 ක අසම්භාව්‍ය වත්කමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු ය.
(4) රු. 5 000 000 ක අසම්භාව්‍ය වගකීමක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළ හෙළිදරව් කළ යුතු ය.
(5) රු. 5 000 000 ක අසම්භාව්‍ය වත්කමක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළ හෙළිදරව් කළ යුතු ය. (……)

**21.** 2025.04.01 දිනට සීමිත කමල් පොදු සමාගමේ මුළු හිමිකම රු. 16 000 000 ක් විය. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම සමාගමට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | රු.'000 |
|---|---|
| රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කිරීම | 4 000 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | 5 000 |
| සාමාන්‍ය කොටස්කරුවන් සඳහා ගෙවූ අතුරු ලාභාංශ | 1 500 |
| සාමාන්‍ය කොටස් සඳහා ප්‍රසිද්ධ නිකුතුවේදී අයදුම්පත් සමඟ එකතු කරගත් මුදල් | 6 000 |

2026.03.01 දින කොටස් 100 000 ක් කොටසක් රු. 50 බැගින් නිකුත් කිරීම සඳහා සමාගම විසින් අයදුම්පත් කැඳවන ලදී. අයදුම්පත් සමඟ මුළු නිකුතු මිලම ගෙවිය යුතු වේ. කොටස් 120 000 ක් සඳහා අයදුම්පත් ලැබුණු අතර 2026.03.31 දින සමාගම විසින් කොටස් විභජනය කරන ලදී. අයදුම්පත් සමඟ ලද අතිරික්ත මුදල්, 2026.04.05 දින ආපසු යවන ලදී.
2026.03.31 දිනට මුළු හිමිකම (රු.'000):

(1) 19 500 (2) 24 500 (3) 25 500 (4) 28 500 (5) 29 500 (……)

- **අංක 22 සහ 23 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නිෂ්පාදන සමාගමක් වන සීමිත සිල්කි පොදු සමාගමේ පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

**2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (රු.'000):**

| | |
|---|---|
| විකුණුම් පිරිවැය | 72 000 |
| මෙහෙයුම් වියදම් | 28 000 |
| පොලී වියදම් | 5 000 |
| ආදායම් බදු වියදම | 2 500 |

| | 2026.03.31 දිනට (රු.'000) | 2025.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| **ජංගම වත්කම්:** | | |
| තොගය | 12 000 | 10 000 |
| කලින් ගෙවූ වියදම් | 2 000 | - |
| වෙළෙඳ ණයගැතියෝ | 22 000 | 18 000 |
| මුදල් හා මුදල් සමාන දෑ | 10 000 | 8 000 |
| **ජංගම වගකීම්:** වෙළෙඳ ණයහිමියෝ | 20 000 | 28 000 |

**අතිරේක තොරතුරු:**

- 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විකුණුම්වලින් 75% ක් ණයට විකුණුම් වන අතර දළ ලාභ අනුපාතය 40% ක් විය.
- වසරක් සඳහා වැඩ කරන දින ගණන 360 ක් බව උපකල්පනය කරන්න.

**22.** 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තොග රඳවාගැනීමේ කාලය සහ ණය එකතු කිරීමේ කාලය පිළිවෙළින්:

| | **තොග රඳවාගැනීමේ කාලය (දින)** | **ණය එකතුකිරීමේ කාලය (දින)** |
|---|---|---|
| (1) | 50 | 60 |
| (2) | 55 | 60 |
| (3) | 55 | 80 |
| (4) | 60 | 80 |
| (5) | 60 | 88 |

(......)

**23.** 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂණික වත්කම් අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය පිළිවෙළින්:

| | **ක්ෂණික වත්කම් අනුපාතය** | **පොලී ආවරණ අනුපාතය (වාර)** |
|---|---|---|
| (1) | 1.6 | 3.0 |
| (2) | 1.6 | 4.0 |
| (3) | 1.7 | 3.0 |
| (4) | 2.3 | 3.5 |
| (5) | 2.3 | 4.0 |

(......)

**24.** භාණ්ඩ කිහිපයක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක, '*සෘජු පිරිවැය*' සහ '*නිෂ්පාදන සහ නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය*' සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - සෘජු පිරිවැය භාණ්ඩයක් සමඟ සෘජුවම හඳුනාගත හැකි අතර, නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය භාණ්ඩවලට අන්තර්ග්‍රහණය කෙරේ.

B - සියලුම සෘජු පිරිවැය ස්වභාවයෙන්ම විචල්‍ය වන අතර සියලුම පොදුකාර්ය පිරිවැය ස්වභාවයෙන්ම ස්ථාවර වේ.

C - සෘජු පිරිවැය සහ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය නිෂ්පාදිත පිරිවැය ලෙස සලකනු ලබන අතර, නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය කාලච්ඡේද පිරිවැය ලෙස සලකනු ලබයි.

(1) B පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

- **අංක 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නිෂ්පාදන ව්‍යාපාරයක නිරන්තරයෙන් භාවිත කරන අමුද්‍රව්‍ය අයිතමයකට 2026 මාර්තු මාසය සඳහා පහත තොරතුරු අදාළ වේ. මෙම ව්‍යාපාරය A සහ B යන භාණ්ඩ දෙක නිෂ්පාදනය කරනු ලබයි.

| **දිනය** | **විස්තරය** |
|---|---|
| 2026.03.01 | ආරම්භක තොගය - කිලෝ ග්‍රෑමයක් රු. 160 බැගින් කිලෝ ග්‍රෑම් 3 000 |
| 2026.03.10 | කිලෝ ග්‍රෑමයක් රු. 200 බැගින් කිලෝ ග්‍රෑම් 5 000 ක් මිල දී ගැනීම |
| 2026.03.16 | A භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා කිලෝ ග්‍රෑම් 2 000 ක් නිකුත් කිරීම |
| 2026.03.27 | B භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා කිලෝ ග්‍රෑම් 3 000 ක් නිකුත් කිරීම |

**25.** තොග මිනුම් කිරීම සඳහා භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමය භාවිත කරන්නේ නම්, **A භාණ්ඩය** සඳහා නිකුත් කළ අමුද්‍රව්‍යවල පිරිවැය සහ 2026.03.31 දිනට අමුද්‍රව්‍ය තොගයේ පිරිවැය:

| | **නිකුත් කළ අමුද්‍රව්‍ය පිරිවැය (රු.'000)** | **2026.03.31 දිනට අමුද්‍රව්‍ය තොගයේ පිරිවැය (රු.'000)** |
|---|---|---|
| (1) | 320 | 600 |
| (2) | 370 | 555 |
| (3) | 555 | 370 |
| (4) | 555 | 555 |
| (5) | 560 | 600 |

(......)

**26.** තොග මිනුම් කිරීම සඳහා පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමය භාවිත කරන්නේ නම් **B භාණ්ඩය** සඳහා නිකුත් කළ අමුද්‍රව්‍යවල පිරිවැය සහ 2026.03.31 දිනට අමුද්‍රව්‍ය තොගයේ පිරිවැය:

| | **නිකුත් කළ අමුද්‍රව්‍ය පිරිවැය (රු.'000)** | **2026.03.31 දිනට අමුද්‍රව්‍ය තොගයේ පිරිවැය (රු.'000)** |
|---|---|---|
| (1) | 480 | 560 |
| (2) | 480 | 600 |
| (3) | 560 | 560 |
| (4) | 560 | 600 |
| (5) | 880 | 600 |

(......)

**27.** 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නුවන් ට්‍රේඩර්ස්හි වැටුප් ලේඛනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

- සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවක සහ සේව්‍ය දායකත්ව පිළිවෙළින් 10% ක් සහ 15% ක් වේ. මීට අමතරව, සේවක භාරකාර අරමුදලට (ETF) සේව්‍ය දායකය 3% කි.
- සේවකයන්ගේ දළ වැටුප මත EPF සහ ETF දායකත්වයන් ගණනය කරනු ලබයි.
- ප්‍රවර්තන වර්ෂය සඳහා EPF අරමුදලට ප්‍රේෂණය කළ මුළු දායකත්වය රු. 750 000 ක් විය.
- ප්‍රවර්තන වර්ෂය තුළදී රක්ෂණ ක්‍රමය සඳහා දායකත්වය ලෙස රු. 70 000 ක් සේවකයන්ගේ වැටුපෙන් අඩු කරනු ලැබී ය.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නුවන් ට්‍රේඩර්ස්හි මුළු ශ්‍රම පිරිවැය (රු.'000):

(1) 3 000 (2) 3 450 (3) 3 540 (4) 3 610 (5) 3 840 (......)

**28.** නිමල් එන්ටර්ප්‍රයිසස් ටයර් නිෂ්පාදනයේ යෙදෙන ව්‍යාපාරයකි. මෙම ව්‍යාපාරය විසින් යන්ත්‍ර සහ නිමැවුම් නම් වූ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් සහ නඩත්තු යන සේවා පිරිවැය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලැබේ.
නිමල් එන්ටර්ප්‍රයිසස්හි නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අදාළ පිරිවැය මධ්‍යස්ථානවලට වෙන් කිරීම සහ විභජනය කිරීම.

B - පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත පිරිවැය මධ්‍යස්ථාන තුන සඳහාම ගණනය කිරීම.

C - නඩත්තු පිරිවැය මධ්‍යස්ථානයේ පොදුකාර්ය පිරිවැය, යන්ත්‍ර සහ නිමැවුම් පිරිවැය මධ්‍යස්ථානවලට නැවත විභජනය කිරීම.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා C පමණි. (5) B හා C පමණි. (......)

**29.** නිෂ්පාදන ආයතනයක පිරිවැය-පරිමා-ලාභ (CVP) විශ්ලේෂණයට අදාළව පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - සමච්ඡේදන ලක්ෂ්‍යයේදී ආයතනයේ මුළු දායකය සහ මුළු ස්ථාවර පිරිවැය සමාන වේ.

B - ආයතනයක මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා අවශ්‍යවන අවම ක්‍රියාකාරී මට්ටම සමච්ඡේදන ලක්ෂ්‍යය මගින් නිරූපණය කරනු ලබයි.

C - සමච්ඡේදන ලක්ෂ්‍යයෙන් ඔබ්බට උපයනු ලබන දායකය ස්ථාවර පිරිවැය ආවරණය කර ගැනීමට දායක වේ.

D - අනිකුත් සියලුම සාධක ස්ථාවරව පවතින විට විකුණුම් මිල ඉහළ යන අවස්ථාවකදී ආයතනයේ සමච්ඡේදන ලක්ෂ්‍යය අඩු වේ.

(1) A හා C පමණි. (2) B හා C පමණි. (3) A, B හා D පමණි.
(4) A, C හා D පමණි. (5) B, C හා D පමණි. (......)

**30.** දිගුකාලීන ආයෝජන ව්‍යාපෘති ඇගයීම සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ව්‍යාපෘතියක් එහි අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතයට වඩා වැඩි ප්‍රතිලාභයක් උපයන බව ව්‍යාපෘතියක ධන ශුද්ධ වර්තමාන අගයක් මගින් නිරූපණය කරනු ලබයි.

B - ව්‍යාපාරයකට ව්‍යාපෘති දෙකක් අතුරෙන් එකක් තෝරා ගැනීමට අවශ්‍ය වන විට, ශුද්ධ වර්තමාන අගය ඉහළ ධන අගයක් සහිත ව්‍යාපෘතිය තෝරාගනු ලබයි.

C - ව්‍යාපෘතියක් ඇගයීම සඳහා පිළිගෙවුම් කාලය භාවිත කිරීමේදී සෑම විටම එම ව්‍යාපෘතියේ සමස්ත මුදල් ප්‍රවාහයම සැලකිල්ලට ගනු ලැබේ.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (......)

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

**31.** ආයතනයක ඇල්මැති පාර්ශ්ව ගිණුම්කරණ තොරතුරු භාවිත කිරීම සම්බන්ධව පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **( F)** යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය / අසත්‍ය** |
|---|---|
| A - ආර්ථික තීරණ ගැනීම සඳහා මූල්‍ය ගිණුම්කරණ තොරතුරු භාවිත කරන්නේ බාහිර ඇල්මැති පාර්ශ්වයන් පමණි. | ............... |
| B - ආයතනයක කාර්යසාධනය ඇගයීමේදී කළමනාකරුවන් විසින් මූල්‍ය නොවන තොරතුරු ද භාවිත කරනු ලබයි. | ............... |
| C - කළමනාකරුවන් විසින් ආයතනයක කටයුතු සැලසුම් කිරීම සහ පාලනය කිරීම සඳහා කළමනාකරණ ගිණුම්කරණ තොරතුරු භාවිත කරනු ලබයි. | ............... |
| D - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආයතනයක බදු වගකීමේ නිරවද්‍යතාවය ඇගයීම සඳහා එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සහ අදාළ අනෙකුත් තොරතුරු භාවිත කරයි. | ............... |

**32.** 2025.01.01 දින රුවන් රු. 750 000 ක් මුදලින් ආයෝජනය කරමින් උපදේශන සේවා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2025.12.31 දිනට පහත ශේෂ වාර්තා කර ඇත.

| **වත්කම් (රු.'000)** | = | **වගකීම් (රු.'000)** | + | **හිමිකම (රු.'000)** |
|---|---|---|---|---|
| 880 | | 180 | | 700 |

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

- රු. 320 000 ක බැංකු ණයක් ලබා ගැනීම සහ සේවා ආදායම් ඉපැයීම නිසා මෙම ව්‍යාපාරයේ වත්කම් රු. 420 000 කින් වැඩි වී ඇත.
- බැංකු ණයෙන් රු. 140 000 ක් පියවීම, රු. 70 000 ක අයිතිකරුගේ මුදල් ගැනිලි, සහ මුදලින් ගෙවූ මෙහෙයුම් සහ මූල්‍ය වියදම් නිසා වත්කම් රු. 290 000 කින් අඩු වී ඇත.

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ සඳහන් කරන්න.

(අ) ලාභය (රු.'000) : ...............................

(ආ) මුළු සේවා ආදායම (රු.'000) : ...............................

(ඉ) මුළු වියදම් (රු.'000) : ...............................

● අංක 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

සහල් තොග වෙළෙන්දෙකු වන නදිකා ට්‍රේඩර්ස් විසින් 2026 ජනවාරි මාසය තුළදී පහත ගනුදෙනු සිදුකර ඇත.

**A** - සහල් කිලෝ ග්‍රෑම් 5 000 ක් රු. 1 200 000 කට සුමුදු සහල් මෝලෙන් ණයට මිල දී ගැනීම.

**B** - සහල් කිලෝ ග්‍රෑම් 2 500 ක් රු. 750 000 කට අමිල ට්‍රේඩර්ස් වෙත ණයට විකිණීම.

**C** - 5% ක මුදල් වට්ටමක් අඩු කිරීමෙන් පසුව අමිල ට්‍රේඩර්ස් වෙතින් ලැබිය යුතු මුළු වටිනාකම පියවීම සඳහා චෙක්පතක් ලැබීම.

**D** - අයිතිකරුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා සහල් කිලෝ ග්‍රෑම් 50 ක් ලබා දීම. මෙම සහල්වල පිරිවැය රු. 12 000 ක් විය.

**E** - 2026.01.01 දින බර කිරීමේ යන්ත්‍රයක් මාස 6 ක කාලයක් සඳහා කුලියට ගැනීමට රු. 120 000 ක් ගෙවීම.

**33.** ඉහත **A, B, C** සහ **D** යන එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා භාවිත කරන මූලික සටහන් පොත සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **මූලික සටහන් පොත** |
|---|---|
| **A** | ........................................................ |
| **B** | ........................................................ |
| **C** | ........................................................ |
| **D** | ........................................................ |

**34.** ඉහත ගනුදෙනු **'D'** සහ **'E'** සැලකිල්ලට ගනිමින් පහත ජර්නල් සටහන් ලියන්න.

(අ) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි සටහන් කිරීමට

(ආ) 2026 ජනවාරි මාසය සඳහා බර කිරීමේ යන්ත්‍රයේ කුලී වියදම ගැළපීමට

| **විස්තරය** | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| (අ)<br><br><br>(2026 ජනවාරි මාසයේ අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි සටහන් කිරීම) | | |
| (ආ)<br><br><br>(2026 ජනවාරි මාසයේ බර කිරීමේ යන්ත්‍ර කුලී වියදම ගැළපීම) | | |

**35.** ආයතනයක, පොදු ලෙජරයේ පවත්වාගෙන යනු ලබන පහත එක් එක් ගිණුම් සඳහා සුදුසු වර්ගීකරණය සඳහන් කරන්න.

| **ගිණුම** | **වර්ගීකරණය** |
|---|---|
| A - ගැනිලි | ........................................................ |
| B - ආපසු යැවුම් | ........................................................ |
| C - වන්දි සඳහා ප්‍රතිපාදනය | ........................................................ |
| D - සමුච්චිත ක්ෂය | ........................................................ |

**36.** තොග වෙළෙන්දෙකු වූ බිමල් එන්ටර්ප්‍රයිසස්හි පහත එක් එක් අවස්ථාවට **වඩාත් උචිත** ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| **අවස්ථාව** | **ගිණුම්කරණ සංකල්පය** |
|---|---|
| A - 2022 වර්ෂයේදී රු. මිලියන 2 කට මිල දී ගත් ඉඩමක් 2026 වර්ෂයේදී ද එම වටිනාකමටම වාර්තා කිරීම. | ................................ |
| B - භාණ්ඩ ණයට විකිණීමෙන් ලැබිය යුතු රු. 310 000 ක් වෙළෙඳ ලැබිය යුතු දෑ සහ අයභාරය ලෙස හඳුනාගැනීම. | ................................ |
| C - වසර පහක කල්බදු ගිවිසුමක් යටතේ අත්පත් කරගත් මෝටර් රථය, භාවිත අයිතිය සහිත වත්කමක් ලෙස හඳුනාගැනීම. | ................................ |
| D - දිගුකාලීන බැංකු ණයක ඊළඟ මූල්‍ය වර්ෂයේ දී ගෙවිය යුතු කොටස ජංගම වගකීමක් ලෙස ඉදිරිපත් කිරීම. | ................................ |

**37.** ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් වූ හරිත සමාජයට 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පහත සඳහන් පරිත්‍යාග ලැබුණි.

A - මෙම සමාජය සඳහා පුස්තකාලයක් ඉදිකිරීමට 2025.10.15 දින රු. 1 500 000 ක පරිත්‍යාගයක් දේශීය සමාගමකින් ලැබුණි. 2025.12.01 දින පුස්තකාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා රු. 200 000 ක් ගෙවන ලදී.

B - පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් කෙටි චිත්‍රපටයක් සකස් කිරීම සඳහා 2026.03.01 දින රු. 500 000 ක මුදලක් විදේශීය සමාගමකින් ලැබුණි. මේ සඳහා 2026.03.15 දින චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකු සමඟ අත්සන් කළ ගිවිසුමට අනුව රු. 150 000 ක අධ්‍යක්ෂ ගාස්තුවක් වාරික 2 කින් ගෙවීමට එකඟ විය. රු. 75 000 ක් වූ පළමු ගෙවීම 2026.03.31 දින සිදු කරන ලදී.

ගිණුම් වර්ෂයක් තුළදී ගෙවීම් කිරීම සඳහා පරිත්‍යාගවලින් භාවිත කරන ලද ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් ආදායම් ලෙස හඳුනාගැනීම මෙම සමාජයේ ප්‍රතිපත්තිය වේ.

ඉහත පරිත්‍යාගවලට අදාළව පහත දෑ හඳුනාගන්න.

(අ) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් පරිත්‍යාග ආදායම (රු.'000) : ..........................................

(ආ) 2026.03.31 දිනට හිමිකමෙහි ශුද්ධ වැඩිවීම (රු.'000) : ..........................................

- **අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ලාල් සහ කමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය අතර 2025.04.01 දින නව හවුල්කරුවෙකු ලෙස නිමල් බඳවා ගන්නා ලදී.

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්වල උධෘතයන් පහත දී ඇත.

**ප්‍රාග්ධන ගිණුම් (රු.'000)**

| | ලාල් | කමල් | නිමල් | | ලාල් | කමල් | නිමල් |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2025.04.01 ශේෂය ඉ/ගෙ | 10 000 | 5 000 | - |
| | | | | මුදල් | - | - | ? |
| කීර්තිනාමය | 600 | 360 | 240 | කීර්තිනාමය | 720 | 480 | - |

**ජංගම ගිණුම් (රු.'000)**

| | ලාල් | කමල් | නිමල් | | ලාල් | කමල් | නිමල් |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2025.04.01 ශේෂය ඉ/ගෙ | 400 | 200 | - |
| | | | | වැටුප් | 2 500 | 2 000 | 1 800 |
| මුදල් | 1 000 | 1 000 | 1 000 | ප්‍රාග්ධන පොලිය | ? | ? | 376 |

**අතිරේක තොරතුරු:**
- වර්ෂ අවසාන ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.

**38.** නිමල් හවුල්කරුවෙකු ලෙස බඳවාගත් දිනට පහත දෑ සඳහන් කරන්න.

(අ) හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය (රු.'000) : ..............................

(ආ) නිමල් විසින් රැගෙන ආ මුදල (රු.'000) : ..............................

**39.** ලාල්, කමල් සහ නිමල් හවුල් ව්‍යාපාරය සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) ලාභ බෙදාගැනීමේ අනුපාතය : ..............................

(ආ) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගැනිලි (රු.'000) : ..............................

(ඉ) ප්‍රාග්ධන ශේෂ මත මුළු පොලිය (රු.'000) : ..............................

**40.** 2018 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ සංකල්පනාත්මක රාමුවට අනුව පහත සඳහන් එක් එක් ප්‍රකාශයට අදාළව **වඩාත් උචිත**, ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ගති ලක්ෂණය සඳහන් කරන්න.

A - මූල්‍ය ප්‍රකාශන තුළ ලබාදෙන තොරතුරුවලට, ඒවා භාවිත කරන්නන්ගේ ආර්ථික තීරණ සඳහා බලපෑම් කළ හැකි වේ. ..........................................

B - මූල්‍ය ප්‍රකාශන තුළ ලබාදෙන තොරතුරු, මධ්‍යස්ථ, සම්පූර්ණ සහ වැරදිවලින් තොර විය යුතු ය. ..........................................

C - තොරතුරු භාවිත කරන පාර්ශ්වයන්ට එම තොරතුරුවල වැදගත්කම ඉක්මවීමට පෙර ඒවා ලබාදිය යුතු ය. ..........................................

D - තොරතුරු භාවිත කරන පාර්ශ්වයන්ට මූල්‍ය ප්‍රකාශන තුළ අයිතම අතර ඇති සමානකම් සහ වෙනස්කම් හඳුනාගැනීමට සහ තේරුම් ගැනීමට තොරතුරු උපයෝගී කරගත හැකි විය යුතු ය. ..........................................

**41.** 'LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ' ප්‍රමිතයට අනුව සුදුසු යෙදුම් භාවිත කර පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - වත්කමක පිරිවැයෙන් එහි සුන්බුන් අගය අඩු කළ විට ලැබෙන අගය ................................ ලෙස හඳුන්වන අතර එම වටිනාකම වත්කමේ ඵලදායී ජීවකාලය තුළ ................................ බෙදාහැරීම ක්ෂයවීම ලෙස හඳුන්වයි.

B - දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනීමෙන් පසුව මිනුම් කිරීම සඳහා ආයතනයක් විසින් එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස ................................ හෝ ................................ තෝරාගත යුතු ය.

**42.** සීමිත සනුගා පොදු සමාගම 2022.04.01 දින රු. 12 000 000 ක යන්ත්‍රයක් මිල දී ගත් අතර එහි ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 10 ක් සහ රු. 2 000 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සමාගම මෙම යන්ත්‍රය 2024.03.31 දින රු. 6 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. එදිනට එහි සුන්බුන් අගය ශුන්‍ය ලෙස ද ඉතිරි ඵලදායී ජීවකාලය වෙනස් නොවන බව ද ඇස්තමේන්තු කරන ලදී. පසුව 2025.04.01 දින, මෙම යන්ත්‍රයෙහි ඉතිරි ඵලදායී ජීවකාලය වසර 5 ක් ලෙස සංශෝධනය කරන ලද අතර එහි සුන්බුන් අගය ශුන්‍ය ලෙස ඇස්තමේන්තු කරන ලදී.

මෙම යන්ත්‍රය සඳහා පහත දෑ දක්වන්න:

(අ) 2024.03.31 දිනට ප්‍රත්‍යාගණන අතිරික්තය/(ඌනතාවය) (රු.'000) : ................................

(ආ) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂයවීම් (රු.'000) : ................................

(ඉ) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂයවීම් (රු.'000) : ................................

**43.** 'LKAS 2 – තොග' ප්‍රමිතයට අනුව පහත සඳහන් එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **(F)** යන්න සඳහන් කරන්න.

| | **ප්‍රකාශය** | **සත්‍ය / අසත්‍ය** |
|---|---|---|
| A - | තොග මිනුම් කළ යුත්තේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට වේ. | ............... |
| B - | විශේෂිත හඳුනාගැනීමේ ක්‍රමය භාවිත කළ හැකි අවස්ථාවක වුවද පිරිවැය සූත්‍ර මත තොගයේ පිරිවැය තීරණය කළ යුතු වේ. | ............... |
| C - | තොග ශුද්ධ උපලබ්ධි අගයට ලියා හැරීම සඳහා සාමාන්‍යයෙන් යොදාගනු ලබන්නේ අයිතම ක්‍රමය වේ. | ............... |
| D - | තොගයේ පිරිවැය මිනුම් කිරීමේදී පරිවර්තන පිරිවැය සහ විකිණීමේ පිරිවැය යන දෙකම ඇතුළත් කරනු ලබයි. | ............... |

**44.** 2025.04.01 දින අක්මාල් පොදු සමාගම මෝටර් රථයක් අත්පත් කර ගැනීම සඳහා කල්බදු ගිවිසුමකට එළඹුණි. මෙදින සමාගම විසින් රු. 6 000 000 ක මූලික ගෙවීමක් සිදු කරන ලද අතර රු. 250 000 ක මූලික සෘජු පිරිවැයක් ද දරන ලදී. කල්බදු ගෙවීම්වල වර්තමාන අගය රු. 15 000 000 ක් වේ. කල්බදු පොලිය රු. 800 000 ක් ද ඇතුළත් පළමු කල්බදු වාරිකය වූ රු. 2 300 000 ක් 2026.03.31 දින ගෙවන ලදී.

'LKAS 7 – මුදල් ප්‍රවාහ ප්‍රකාශය' ප්‍රමිතයට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම කල්බද්දට අදාළව පහත ශුද්ධ මුදල් ප්‍රවාහ:

(අ) ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ (රු.'000) : ................................

(ආ) මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ (රු.'000) : ................................

**45.** සමාගමක ගිණුම්කරණ අනුපාතවලට අදාළව පහත එක් එක් ප්‍රකාශ **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **(F)** යන්න සඳහන් කරන්න.

| | **ප්‍රකාශය** | **සත්‍ය / අසත්‍ය** |
|---|---|---|
| A - | සමාගම විසින් තොග කාර්යක්ෂමව කළමනාකරණය කරන බව ඉහළ තොග පිරිවැටුම් අනුපාතයක් මඟින් දක්වනු ලබයි. | ............... |
| B - | සමාගමක ලාභයෙන් එහි සාමාන්‍ය කොටස්හිමියන්ට බෙදාහරින ලද ලාභ ප්‍රමාණය, කොටසක ඉපැයුම මඟින් නිරූපණය කරනු ලබයි. | ............... |
| C - | සමාගමක හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය ගණනය කිරීමේදී කාලච්ඡේදය සඳහා බදු පසු ශුද්ධ ලාභය යොදාගනු ලබයි. | ............... |
| D - | ණය හිමිකම් අනුපාතය මඟින් සමාගමක ණය ප්‍රාග්ධනය එහි මුළු ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස පෙන්නුම් කරනු ලබයි. | ............... |

**46.** ආයතනයක ද්‍රව්‍ය කළමනාකරණයට අදාළව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - තොග අයිතමයක වාර්ෂික ඇණවුම් පිරිවැයෙහි සහ වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැයෙහි එකතුව ................................ වන ඇණවුම් ප්‍රමාණය, ආර්ථික ඇණවුම් ප්‍රමාණය ලෙස හඳුන්වනු ලබයි.

B - සැපයුම්කරුවෙකුගෙන් ද්‍රව්‍ය ලද බව සනාථ කිරීම සඳහා ගබඩා දෙපාර්තමේන්තුව විසින් ................................ ................................ පිළියෙල කරනු ලබයි.

C - යම් ද්‍රව්‍යයක තොග මට්ටම ................................ දක්වා ළඟා වූ විට, ගබඩා දෙපාර්තමේන්තුව විසින් ................................ ගැනුම් දෙපාර්තමේන්තුවට නිකුත් කරනු ලබයි.

[දොළොස්වැනි පිටුව බලන්න.

**47.** ඇඟලුම් කර්මාන්ත ශාලාවක නිතර භාවිත කරනු ලබන රෙදි වර්ගයක ඇස්තමේන්තුගත වාර්ෂික ඉල්ලුම මීටර 400 000 ක් වේ. එහි ඇණවුම් පිරිවැය ඇණවුමක් සඳහා රු. 25 000 ක් වන අතර වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය මීටරයකට රු. 50 ක් වේ. කර්මාන්ත ශාලාවේ අතීත අත්දැකීම් මත එහි ඇස්තමේන්තුගත දෛනික පරිභෝජනය සහ පොරොත්තු කාලය පහත පරිදි වේ.

| | අවම | උපරිම |
|---|---|---|
| දෛනික පරිභෝජනය (මීටර) | 1 100 | 2 300 |
| පොරොත්තු කාලය (දින) | 3 | 7 |

මෙම රෙදි වර්ගයේ යළි ඇණවුම් ප්‍රමාණය, ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) මත තීරණය කරනු ලබයි. මෙම රෙදි වර්ගය සඳහා පහත දෑ සඳහන් කරන්න.

(අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) : මීටර ..............................

(ආ) යළි ඇණවුම් මට්ටම : මීටර ..............................

(ඉ) උපරිම තොග මට්ටම : මීටර ..............................

**48.** නිෂ්පාදන ව්‍යාපාරයක් එක් භාණ්ඩ වර්ගයක් නිපදවනු ලබයි. පහත පිරිවැය ඇස්තමේන්තු සිදු කර ඇත්තේ මෙම භාණ්ඩයේ ක්‍රියාකාරී මට්ටම ඒකක 50 000 ක් වන විට ය.

| | රු.'000 |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය පිරිවැය | 5 250 |
| සෘජු ශ්‍රම පිරිවැය | 7 500 |
| වෙනත් සෘජු පිරිවැය | ? |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 1 250 |
| පරිපාලන සහ විකුණුම් පොදුකාර්ය පිරිවැය | 2 700 |

**අතිරේක තොරතුරු:**

- සියලු සෘජු පිරිවැය විචල්‍ය පිරිවැය වේ.
- වෙනත් සෘජු පිරිවැය, මුළු ප්‍රාථමික පිරිවැයෙන් 25% ක් ලෙස ඇස්තමේන්තු කෙරේ.
- නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සෘජු ශ්‍රම පැය මත පදනම්ව අන්තර්ග්‍රහණය කෙරේ.
- ඒකක 50 000 ක් නිෂ්පාදනය කිරීම සඳහා අයවැයගත සෘජු ශ්‍රම පැය ගණන 125 000 ක් වේ.
- පරිපාලන සහ විකුණුම් පොදුකාර්ය පිරිවැය ක්‍රියාකාරී මට්ටම ඒකක 50 000 වන තෙක් ස්ථාවර වේ.

පහත දෑ සඳහන් කරන්න.

(අ) ඒකකයක් සඳහා ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය (රු.) : ..............................

(ආ) ඒකකයක් සඳහා ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදන පිරිවැය (රු.) : ..............................

(ඉ) ක්‍රියාකාරී මට්ටම ඒකක 35 000 ක් වන විට මුළු පිරිවැය (රු.'000) : ..............................

**49.** නිෂ්පාදන සමාගමක් එක් භාණ්ඩ වර්ගයක් නිෂ්පාදනය කරනු ලබන අතර කාලච්ඡේදය සඳහා එහි අපේක්ෂිත විකුණුම් ඒකක 15 000 ක් වේ. ඒකක 6 000 ක සමච්ඡේදන ලක්ෂ්‍යයේදී මුළු විචල්‍ය පිරිවැය රු. 300 000 ක් වේ. මෙම භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල රු. 80 ක් වේ.

පහත දෑ හඳුනාගන්න.

(අ) ඒකකයක් සඳහා දායකය (රු.) : ..............................

(ආ) මුළු ස්ථාවර පිරිවැය (රු.'000) : ..............................

(ඉ) ආරක්ෂිත ආන්තිකය වටිනාකමින් (රු.'000) : ..............................

(ඊ) ඒකක 10 000 ක ක්‍රියාකාරී මට්ටමේදී ලාභය (රු.'000) : ..............................

**50.** සීමිත RDK සමාගම 'ඇල්ෆා' සහ 'බීටා' යන ආයෝජන ව්‍යාපෘති දෙකෙහි යෝග්‍යතාවය සලකා බලමින් සිටී. මෙම ව්‍යාපෘති දෙක සඳහා පහත තොරතුරු දී ඇත.

| | ඇල්ෆා | බීටා |
|---|---|---|
| ආරම්භක ආයෝජනය (රු.'000) | (2 250) | (2 250) |
| ව්‍යාපෘතියේ ජීව කාලය (වර්ෂ) | 5 | 5 |
| වාර්ෂික ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහවල වර්තමාන අගය (රු.'000) | 2 000 | 1 800 |
| පස්වන වසර අවසානයේ ලැබීමට නියමිත සුන්බුන් අගයේ වර්තමාන අගය (රු.'000) | 124 | 217 |

මෙම ව්‍යාපෘති සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයක් නොමැති බව උපකල්පනය කරන්න.

පහත දෑ හඳුනාගන්න.

(අ) එක් එක් ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV) (රු.'000)

ඇල්ෆා : ..............................................

බීටා : ..............................................

(ආ) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව නිර්දේශය : ..............................................

(ඉ) මෙම නිර්දේශය සඳහා හේතුව : ..............................................



Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

**උපදෙස්:**
- ※ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ※ සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- ※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- ※ මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

**1.** සීමිත නිමාලි පොදු සමාගම පරිගණක නිෂ්පාදනය කර විකුණන අතර විකුණන ලද පරිගණක සඳහා නඩත්තු සේවාද සපයනු ලබයි. 2026.03.31 දිනට එහි සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැය | 235 000 | |
| 2025.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ - සමුච්චිත ක්ෂය | | 40 000 |
| භාවිත අයිතිය සහිත වත්කම | 62 500 | |
| 2025.04.01 දිනට අමුද්‍රව්‍ය තොගය | 2 500 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 13 680 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 41 800 | |
| විකුණුම් අයභාරය | | 488 000 |
| නඩත්තු සේවා අයභාරය | | 14 400 |
| 2025.04.01 දිනට නොඉපයූ නඩත්තු සේවා අයභාරය | | 5 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 244 700 | |
| බෙදාහැරීමේ පිරිවැය | 35 500 | |
| පරිපාලන වියදම් | 43 500 | |
| මූල්‍ය පිරිවැය | 1 500 | |
| කල්බදු වගකීම | | 40 608 |
| වගකීම් සහතික යටතේ ගෙවූ අලුත්වැඩියා වියදම් | 2 250 | |
| 2025.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | | 2 750 |
| ගෙවූ ආදායම් බදු | 12 500 | |
| 2025.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 1 650 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (කොටසක් රු. 10 බැගින් නිකුත් කළ) | | 70 000 |
| 2025.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 25 662 |
| ගෙවූ අතුරු ලාභාංශ | 20 000 | |
| | **701 750** | **701 750** |

**අතිරේක තොරතුරු:**

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතු වේ.

(i) 2026.03.31 දින එදිනට පැවති සෑම කොටස් 7 කට 1 බැගින් කොටසක් රු. 10 ක ප්‍රතිෂ්ඨාවකට නිකුත් කරමින් සමාගම විසින් රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරන ලදී. මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(ii) 2026.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු. 2 950 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

[දෙවැනි පිටුව බලන්න.

(iii) ශේෂ පිරික්සුමේ දක්වා ඇති දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැයෙහි සහ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි වේ.

| | පිරිවැය (රු.'000) | 2025.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) |
|---|---|---|
| නිෂ්පාදන පිරියත | 150 000 | 25 000 |
| කාර්යාල උපකරණ | 85 000 | 15 000 |
| | **235 000** | **40 000** |

- 2025.10.01 දින රු. 50 000 000 කට නව නිෂ්පාදන පිරියතයක් අත්පත් කර ගත් අතර එය නිසි පරිදි ගිණුම්ගත කර ඇත.
- 2024.01.01 දින මිල දී ගත් පිරිවැය රු. 25 000 000 ක් වූ කාර්යාල උපකරණයක් 2026.01.01 දින රු. 8 000 000 කට විකුණන ලදී. මෙම විකුණුම් වටිනාකම මුදල් ගිණුමට හර කර විකුණුම් අයභාර ගිණුමට බැර කර ඇත. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.
- දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය මත වාර්ෂිකව 20% ක් බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. කෙසේ වුවද ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය වෙන්කර නොමැත.
- කාර්යාල උපකරණ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ.

(iv) ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී පහත දෑ සැලකිල්ලට ගෙන නොමැත.

- ආරම්භක සහ අවසාන අමුද්‍රව්‍ය තොග
- ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය

(v) 2026.03.31 දිනට අමුද්‍රව්‍ය තොගයේ පිරිවැය රු. 2 200 000 ක් විය. ප්‍රවර්තන වර්ෂයේ ආරම්භක හෝ අවසාන නොනිමි තොග නොතිබුණි.

(vi) සමාගම විසින් පරිගණක විකිණීම සහ නඩත්තු සේවා සැපයීම යන ක්‍රම දෙකෙන්ම අයභාරය උපයනු ලබයි. විකුණුම් ගිවිසුමට අනුව විකුණන ලද පරිගණක ගනුදෙනුකරුවන් වෙත බාර දීමට සමාගම බැඳී සිටියි. මෙම කාර්යයන් සඳහා අදාළ තොරතුරු පහත දී ඇත.

- විකුණුම් ගිවිසුමට ඇතුළු වන අවස්ථාවේදීම, පරිගණකවල විකුණුම් වටිනාකම සහ නඩත්තු සේවා ගාස්තුව යන දෙකම එකවර සමාගම විසින් එකතු කර ගනු ලැබේ.
- 2025.04.01 දිනට ආරම්භක නිමි භාණ්ඩ තොග නොවී ය.
- එක් පරිගණකයක විකුණුම් මිල රු. 400 000 ක් වේ. ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් පරිගණක 1 200 ක් නිෂ්පාදනය කරන ලද අතර මෙම සියලු පරිගණක විකිණීම සඳහා ගිවිසුම්වලට ඇතුළත්ව ඇත. එම පරිගණකවලින්, පරිගණක 1 100 ක් පමණක් ප්‍රවර්තන වර්ෂය තුළදී ගනුදෙනුකරුවන්ට බාර දී තිබුණ අතර ඉතිරි පරිගණක 100 2026.03.31 දිනට සමාගමේ ගබඩාවේ පැවතුණි. කෙසේ වුවද පරිගණක 1 200 සඳහාම විකුණුම් වටිනාකම ප්‍රවර්තන වර්ෂයේ විකුණුම් අයභාරය ලෙස හඳුනාගෙන තිබුණි.
- ගනුදෙනුකරුවන්ගෙන් එකතු කර ගත් මුළු නඩත්තු සේවා ගාස්තුව ශේෂ පිරික්සුමේ දක්වා ඇති නඩත්තු සේවා අයභාරය තුළින් නිරූපණය කරනු ලබයි. කෙසේ වුවද මෙම නඩත්තු සේවාවලින් 25% කට අදාළ කාර්යසාධන බැඳීම් පමණක් 2026.03.31 දිනට ඉටු කර තිබුණි.
- පසුගිය වර්ෂයේ නොඉපයූ නඩත්තු සේවා අයභාරවලට අදාළ සියලුම නඩත්තු සේවා, ප්‍රවර්තන වර්ෂය තුළදී සපයා ඇත.

(vii) 2025.04.01 දින වසර 4 ක කාලයක් සඳහා සමාගම විසින් මෝටර් රථයක භාවිත අයිතිය කල්බදු ගිවිසුමක් යටතේ ලබාගන්නා ලදී. 2025.04.01 දිනට මුළු කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම රු. 62 500 000 ක් වූ අතර එය නිවැරදිව ගිණුම්ගත කර ඇත. 2026.03.31 දින ප්‍රථම කල්බදු වාරිකය වූ රු. 21 892 000 ක් ගෙවා ඇති අතර එය කල්බදු වගකීම් ගිණුමට හර කර, මුදල් ගිණුමට බැර කර ඇත. කෙසේ වුවද මේ සඳහා වෙනත් කිසිදු ගැළපීමක් කර නොමැත. 2026.03.31 සහ 2027.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා අදාළ කල්බදු පොලිය පිළිවෙළින් රු. 9 375 000 ක් සහ රු. 7 500 000 ක් වේ. මෝටර් රථයේ ඵලදායී ජීවකාලය වසර 10 ක් වන අතර එහි අයිතිය කල්බදු කාලසීමාව අවසානයේදී සමාගමට මාරු වේ. මෙම මෝටර් රථය ගනුදෙනුකරුවන් වෙත පරිගණක බෙදාහැරීම සඳහා භාවිත කෙරේ.

(viii) ශේෂ පිරික්සුම තුළ දක්වා ඇති ගෙවූ ආදායම් බදු තුළ පසුගිය වර්ෂය සඳහා ගෙවූ රු. 1 900 000 ක් ද ඇතුළත් වේ. 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 13 500 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

**අවශ්‍යවන්නේ:**

'LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත නිමාලි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන:

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2026.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(4) අයභාරය, බදු පෙර ලාභය, දේපළ, පිරියත සහ උපකරණ, භාවිත අයිතිය සහිත වත්කම් සහ තොග සඳහා සටහන්

***(මුළු ලකුණු 40 යි)***

**2. (අ)** මලිත් එන්ටප්‍රයිසස් භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතනයක් වේ. පහත තොරතුරු මෙම ආයතනය විසින් භාවිත කරන අමුද්‍රව්‍ය 'X' සඳහා අදාළ වේ.

- වාර්ෂික ඉල්ලුම - ඒකක 16 000
- යළි ඇණවුම් ප්‍රමාණය (ආර්ථික ඇණවුම් ප්‍රමාණයට සමාන වේ) - ඒකක 2 000
- ඇණවුම් පිරිවැය - ඇණවුමක් සඳහා රු. 500
- ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය ඒකකයක ගැනුම් මිලෙන් 10% කට සමාන වේ.
- සතියක් සඳහා උපරිම පරිභෝජනය - ඒකක 360
- උපරිම තොග මට්ටම - ඒකක 3 320
- අවම තොග මට්ටම - ඒකක 720
- යළි ඇණවුම් මට්ටම - ඒකක 2 520
- අවම පොරොත්තු කාලය - සති 5

**අවශ්‍යවන්නේ:**

අමුද්‍රව්‍ය 'X' සඳහා පහත දෑ:

(1) සාමාන්‍ය තොග මට්ටම (ඒකක)
(2) උපරිම පොරොත්තු කාලය (සති)
(3) සතියක අවම පරිභෝජනය (ඒකක)
(4) වර්ෂයක් තුළදී සිදු කළ යුතු ඇණවුම් ගණන
(5) වාර්ෂික ඇණවුම් පිරිවැය
(6) ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය
(7) ඒකකයක ගැනුම් මිල
(8) ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඇණවුම් කරන්නේ නම් වාර්ෂික මුළු පිරිවැය

***(ලකුණු 10 යි)***

**(ආ)** කමිස සහ කලිසම් නිපදවනු ලබන ඇඟළුම් කර්මාන්තශාලාවක් 'කැපුම්' සහ 'මැහුම්' නම්වූ නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් සහ 'ගබඩාව' යන සේවා දෙපාර්තමේන්තුවකින් සමන්විත වේ. නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක එකම ගොඩනැගිල්ලකද ගබඩාව වෙනත් ගොඩනැගිල්ලකද පිහිටා ඇත.

ඉදිරි කාලච්ඡේදය සඳහා අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටම ඒකක 70 000 ක් වන අතර එම මට්ටමේදී අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| **විස්තරය** | **එකතුව** (රු.'000) | **නිෂ්පාදන දෙපාර්තමේන්තු** (රු.'000) | **ගබඩාව** (රු.'000) |
|---|---|---|---|
| නිෂ්පාදන යන්ත්‍ර සඳහා රක්ෂණ වාරිකය .................... | 40 | 40 | - |
| ගබඩා නඩත්තු පිරිවැය .................... | 160 | - | 160 |
| නිෂ්පාදන කළමනාකරුවන් සඳහා වැටුප්.................... | 320 | 320 | - |
| නිෂ්පාදන යන්ත්‍රවල ක්ෂය .................... | 360 | 360 | - |
| වක්‍ර වේතන.................... | 400 | 350 | 50 |
| ගොඩනැගිලි ක්ෂය .................... | 480 | 400 | 80 |
| විදුලි පිරිවැය .................... | 80 | ? | ? |
| ආරක්ෂක සේවකයින්ගේ වැටුප් .................... | 240 | ? | ? |
| තොරතුරු පද්ධතියේ මෙහෙයුම් පිරිවැය.................... | 420 | ? | ? |
| වෙනත් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය .................... | 500 | ? | ? |

**අතිරේක තොරතුරු:**

(i) නිෂ්පාදන යන්ත්‍ර සඳහා රක්ෂණ වාරිකය: කැපුම් දෙපාර්තමේන්තුව සඳහා රු. 27 500 ක් සහ මැහුම් දෙපාර්තමේන්තුව සඳහා රු. 12 500 ක් වේ.

(ii) නිෂ්පාදන සහ සේවා දෙපාර්තමේන්තුවලට අදාළ වෙනත් තොරතුරු:

| | **කැපුම්** | **මැහුම්** | **ගබඩාව** |
|---|---|---|---|
| මුළු සේවක සංඛ්‍යාව (නිෂ්පාදන කළමනාකරුවන් සහ ආරක්ෂක සේවකයන් ද ඇතුළත්ව).................... | 96 | 71 | 11 |
| නිෂ්පාදන කළමනාකරුවන් සංඛ්‍යාව .................... | 10 | 6 | - |
| ආරක්ෂක සේවක සංඛ්‍යාව.................... | 6 | 5 | 1 |
| මුළු කිලෝවොට් පැය .................... | 10 000 | 7 000 | 3 000 |
| ගොඩනැගිලිවල භූමි ප්‍රමාණය (වර්ග මීටර).................... | 3 000 | 1 000 | 500 |
| නිෂ්පාදන යන්ත්‍රවල ධාරණ වටිනාකම (රු.'000) .................... | 1 900 | 1 700 | - |
| තොරතුරු පද්ධතිය මගින් ජනනය කරනු ලබන වාර්තා සංඛ්‍යාව | 24 | 24 | 24 |
| මුළු අයවැයගත යන්ත්‍ර පැය .................... | 5 000 | 1 000 | - |
| මුළු අයවැයගත සෘජු ශ්‍රම පැය.................... | 500 | 4 000 | - |

(iii) වෙනත් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සහ ගබඩාව අතර පිළිවෙළින් 7:3 අනුපාතයට විභජනය කෙරේ. නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට විභජනය කරන ලද වෙනත් නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, කැපුම් සහ මැහුම් දෙපාර්තමේන්තු දෙක අතර පිළිවෙළින් 4:3 අනුපාතයට බෙදා හැරේ.

(iv) ගබඩාවේ මුළු පොදුකාර්ය පිරිවැය, කැපුම් සහ මැහුම් දෙපාර්තමේන්තු අතර පිළිවෙළින් 5:3 අනුපාතයට නැවත විභජනය කරනු ලබයි.

[හතරවැනි පිටුව බලන්න.

070003
02030001580110003

(v) කැපුම් සහ මැහුම් දෙපාර්තමේන්තුවල මුළු පොදුකාර්ය පිරිවැය පිළිවෙළින් යන්ත්‍ර පැය සහ සෘජු ශ්‍රම පැය මත ඒකකවලට අන්තර්ග්‍රහණය කරයි.

(vi) ඒකකයක් නිෂ්පාදනය කිරීමට එක් එක් දෙපාර්තමේන්තුවේ ගත කළ සත්‍ය කාලය:

| | **කමිස** | **කලිසම්** |
|---|---|---|
| සෘජු ශ්‍රම පැය: | | |
| කැපුම් | 2 | 1 |
| මැහුම් | 1 | 0.5 |
| යන්ත්‍ර පැය: | | |
| කැපුම් | 2 | 2 |
| මැහුම් | 1 | 1 |

(vii) ඒකකයක සෘජු පිරිවැය පහත දී ඇත.

| | **කමිස (රු.)** | **කලිසම් (රු.)** |
|---|---|---|
| සෘජු අමුද්‍රව්‍ය පිරිවැය | 500 | 600 |
| සෘජු ශ්‍රම පිරිවැය | 480 | 430 |

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) කැපුම් සහ මැහුම් දෙපාර්තමේන්තු සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) එක් කමිසයක සහ එක් කලිසමක මුළු නිෂ්පාදන පිරිවැය *(එක් එක් පිරිවැය අයිතමය වෙන වෙනම දක්වන්න)*

(4) මුළු නිෂ්පාදන පිරිවැය මත 25% ක ලාභ අනුපාතයක් පවත්වා ගන්නේනම්:

(i) කමිසයක විකුණුම් මිල සහ කලිසමක විකුණුම් මිල

(ii) කලිසම් 25 000 ක් විකුණූ විට ලැබෙන මුළු ලාභය **(ලකුණු 30 යි)**

**(මුළු ලකුණු 40 යි)**

3. **(අ)** 2026.04.01 දින සරත් සහ රාජු හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර එය වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. හවුල්කරුවන්ගේ හිමිකම් සම්බන්ධයෙන් මෙම හවුල්කරුවන් දෙදෙනා අතර ලිඛිත, වාචික හෝ හැඟවීමෙන් එකඟතාවයක් නොමැත. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. 2026 අප්‍රේල් මාසය තුළදී මෙම ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදු විය.

| **අංකය** | **ගනුදෙනුව** |
|---|---|
| 1 | සරත් සහ රාජු ඔවුන්ගේ ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 600 000 ක් බැගින් ආයෝජනය කරන ලදී. |
| 2 | 2026.04.01 දින පරිපාලන කටයුතුවලදී භාවිතය සඳහා එකක් රු. 300 000 ක් බැගින් පරිගණක 3 ක් මිල දී ගන්නා ලදී. මෙයට අදාළව රු. 360 000 ක් රාජු විසින් ගෙවන ලද අතර ඉතිරි මුදල වූ රු. 540 000 ව්‍යාපාරය විසින් ගෙවන ලදී. රාජු විසින් ගෙවූ මුදල ඔහු විසින් ව්‍යාපාරයට දෙන ලද ණයක් ලෙස සැලකීමට එකඟ විය. (මෙම මිල දී ගැනීමට අදාළව VAT නොමැති බව උපකල්පනය කරන්න.) |
| 3 | අමල් එන්ටර්ප්‍රයිසස් වෙතින් රු. 590 000 ක භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී (රු. 90 000 ක VAT ඇතුළත්ව). |
| 4 | අමල් එන්ටර්ප්‍රයිසස් වෙතින් රු. 59 000 කට ණයට මිල දී ගත් භාණ්ඩ, දෝෂ හේතුවෙන් ආපසු යවන ලදී. (රු. 9 000 ක VAT ඇතුළත්ව). |
| 5 | රු. 20 000 ක මුදල් වට්ටමක් ලැබීමෙන් පසුව අමල් එන්ටර්ප්‍රයිසස් වෙත රු. 511 000 ගෙවන ලදී. |
| 6 | රු. 177 000 කට භාණ්ඩ අත්පිට මුදලට විකුණන ලදී (රු. 27 000 ක VAT ඇතුළත්ව). මෙම භාණ්ඩවල පිරිවැය රු. 120 000 ක් විය. |
| 7 | සුනිමල් එන්ටර්ප්‍රයිසස් වෙත රු. 354 000 ක භාණ්ඩ ණයට විකුණන ලදී (රු. 54 000 ක VAT ඇතුළත්ව). මෙම භාණ්ඩවල පිරිවැය රු. 240 000 ක් විය. |
| 8 | සුනිමල් එන්ටර්ප්‍රයිසස් වෙත රු. 29 500 කට ණයට විකුණූ භාණ්ඩ ආපසු එවන ලදී (රු. 4 500 ක VAT ඇතුළත්ව). මෙම භාණ්ඩවල පිරිවැය රු. 20 000 ක් විය. |
| 9 | රු. 24 500 ක මුදල් වට්ටමක් ලබා දීමෙන් පසු සුනිමල් එන්ටර්ප්‍රයිසස් වෙතින් රු. 300 000 ක් ලැබුණි. |
| 10 | සරත්ට සහ රාජුට පිළිවෙළින් රු. 30 000 ක සහ රු. 20 000 ක පිරිවැය වූ භාණ්ඩ ඔවුන්ගේ පුද්ගලික භාවිතය සඳහා සපයන ලදී. |
| 11 | රාජුගේ ණය මත මාසික පොලිය ගෙවන ලදී. |
| 12 | පරිගණක මත මාසික ක්ෂය වෙන්කරන ලදී. (පරිගණකයක ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය වසර 5 ක් වන අතර සුන්බුන් අගය ශුන්‍ය වේ.) |

**අවශ්‍යවන්නේ:**

(1) අංක 1 සිට 12 දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර එක් එක් අගය ඉදිරියෙන් අගය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. ගැනුම්, ආපසු යැවුම්, විකුණුම් සහ ආපසු එවුම් යන සියල්ලම මත VAT, ගිණුම්කරණ සමීකරණයේ VAT පාලන තීරුවේ සටහන් කළ යුතු වේ. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න).

(රු. 000)

| ගනුදෙනු අංකය | වත්කම් | | | = | වගකීම් | + | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | මුදල් | රාජුගේ ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | VAT පාලන | |
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| ---- | | | | | | | | |
| ---- | | | | | | | | |
| 2026.04.30 දිනට ශේෂය | | | | | | | | |

(2) හිමිකම් තීරුව මත පදනම්ව ගණනය කිරීම පෙන්වමින් 2026.04.30 දිනෙන් අවසන් මාසය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය

(3) 2026.04.30 දිනෙන් අවසන් මාසය සඳහා සරත් සහ රාජුගේ ලාභ කොටස් වෙන් වෙන්ව **(ලකුණු 25 යි)**

**(ආ)** 2025.04.01 දින 'රන්මිණි' ක්‍රීඩා සමාජය ආරම්භ කරන ලදී. පහත තොරතුරු 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයට අදාළ වේ.

(i) **යාවජීව සාමාජිකත්වය:**

- 2025.04.01 දින රු. 500 000 ක් බැගින් ක්‍රීඩා සමාජයේ බැංකු ගිණුමෙහි තැන්පත් කරමින් සාමාජිකයන් 4 දෙනෙකු විසින් යාවජීව සාමාජිකත්වය ලබාගන්නා ලදී. යාවජීව සාමාජික මුදල වර්ෂ 10 ක් පුරා සමානව ආදායම ලෙස හඳුනාගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

(ii) **වාර්ෂික සාමාජික මුදල්:**

- වාර්ෂික සාමාජික මුදල රු. 60 000 ක් වේ. මෙම මුදල මාසිකව රු. 5 000 බැගින් සමාන වටිනාකම්වලින් ගෙවිය හැක. ක්‍රීඩා සමාජයට බැඳෙන අවස්ථාවේදී රු. 10 000 ක ඇතුළත්වීමේ ගාස්තුවක්ද ගෙවිය යුතු වේ. ඇතුළත්වීමේ ගාස්තුව එය ලද වර්ෂයේදීම ආදායම ලෙස හඳුනාගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.
- ප්‍රවර්තන වර්ෂය තුළදී සාමාජිකත්වය ලබාගත් සාමාජිකයින්ගේ තොරතුරු පහත පරිදි වේ.

| දිනය | බැඳුණු සංඛ්‍යාව | ගෙවූ සාමාජික මුදල් (රු.'000) | ගෙවූ ඇතුළත් වීමේ ගාස්තුව (රු.'000) |
|---|---|---|---|
| 2025.04.01 | 20 | 1 200 | 200 |
| 2025.07.01 | 15 | 750 | 150 |

- 2025.07.01 දින බැඳුණු සාමාජිකයින්ගෙන් 10 දෙනෙකු වර්ෂයක කාලයක් සඳහා සාමාජික මුදල් ගෙවන ලද අතර ඉතිරි සාමාජිකයන් 5 දෙනා මාස 6 කට පමණක් සාමාජික මුදල් ගෙවන ලදී.

(iii) **පරිත්‍යාග:**

- පාසල් සිසුන් පුහුණු කිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් රු. 400 000 ක පරිත්‍යාගයක් 2025.10.01 දින ක්‍රීඩා සමාජයට ලැබුණි. 2025.10.01 දිනෙන් ආරම්භ වී වසර 4 ක කාලයක් සඳහා මෙම පරිත්‍යාගය ලබාදී ඇත. වාර්ෂික පුහුණු කිරීමේ වියදම රු. 100 000 ක් වේ. මෙම වියදම වර්ෂය තුළදී සමානව දරන ලදී.
- විදේශ රටක පදිංචි ශ්‍රී ලාංකිකයෙකු විසින් රු. 750 000 ක් වටිනා කායවර්ධන උපකරණ 2025.11.01 දින පරිත්‍යාග කරන ලදී.
- වර්ෂයක් තුළදී පරිත්‍යාගවලට අදාළව දරන ලද වියදම්වලට සමාන වටිනාකමක් ආදායම ලෙස හඳුනාගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

(iv) **වෙනත්:**

- ප්‍රවර්තන වර්ෂය තුළදී මුදලින් කරන ලද ගෙවීම්: 2025.07.01 දින රු. 800 000 ක පිරිවැයකට ක්‍රීඩා උපකරණ මිලට ගැනීම සහ පාසල් ළමුන්ගේ පුහුණු වියදම්ද ඇතුළත්ව මෙහෙයුම් වියදම් රු. 630 000 ක් ගෙවීම.
- ක්‍රීඩා උපකරණ සහ කායවර්ධන උපකරණ යන දෙවර්ගයම වාර්ෂිකව 20% බැගින් පිරිවැය මත ක්ෂය කරනු ලැබේ. ක්‍රීඩා උපකරණ ඒවා මිලට ගත් දින සිටම භාවිතය සඳහා පැවති අතර, කායවර්ධන උපකරණ 2025.12.01 දින සිට භාවිතය සඳහා පැවතුණි.

**අවශ්‍යවන්නේ:**

'රන්මිණි' ක්‍රීඩා සමාජය සඳහා පහත දෑ:

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ගිණුම

(2) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(3) 2026.03.31 දිනට හිමිකමේ සංයුතිය **(ලකුණු 15 යි)**

**(මුළු ලකුණු 40 යි)**

070003

**4. (අ)** තොග වෙළෙඳ ව්‍යාපාරයක් වන අජන්තා ට්‍රේඩර්ස් භාණ්ඩ ගැනුම් සහ විකුණුම් ණය පදනමට මෙන්ම අත්පිට මුදලටත් සිදු කරනු ලබයි. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අතර විකුණුම් මිල මත 20% ක ලාභ ආන්තිකයක් තබා ගනිමින් භාණ්ඩ විකුණනු ලබයි.

2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත තොරතුරු අදාළ වේ.

(i) 2026.01.01 දිනට වත්කම් සහ වගකීම් ශේෂ:

| | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 4 800 |
| තොගය | 300 |
| වෙළෙඳ ණයගැතියෝ | 950 |
| වෙළෙඳ ණයහිමියෝ | 700 |
| ගෙවිය යුතු VAT | 36 |
| මුදල් | 150 |

(ii) 2026.01.01 දිනට වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල 2026.01.18 දින ලැබුණි.

(iii) 2026.01.01 දිනට වෙළෙඳ ණයහිමියන්ට ගෙවිය යුතු මුදල සහ ගෙවිය යුතු VAT 2026.01.22 දින ගෙවන ලදී.

(iv) 2026 ජනවාරි මාසයේදී ණයට ගැනුම් සහ ණයට විකුණුම්වලට අදාළ තොරතුරු:

**ගැනුම් ජර්නලය (රු.'000)**

| දිනය | විස්තරය | වටිනාකම | ගැනුම් | VAT |
|---|---|---|---|---|
| 2026.01.08 | ආලෝකා ට්‍රේඩර්ස් | 590 | 500 | 90 |
| 2026.01.18 | සමිත ට්‍රේඩර්ස් | 826 | 700 | 126 |
| **එකතුව** | | **1 416** | **1 200** | **216** |

- වෙළෙඳ ණයහිමියන්ට ගෙවිය යුතු මුදල පියවීමට භාණ්ඩ මිලට ගත් දින සිට දින 30 ක ණය කාලයක් ලබාදෙන අතර මුළු මුදලම දින 15 ක් ඇතුළත පියවන්නේ නම් 10% ක වට්ටමක් ලබාදෙනු ලැබේ.
- ආලෝකා ට්‍රේඩර්ස් වෙත ගෙවිය යුතු මුදල 2026.01.20 දින පියවන ලදී.

**විකුණුම් ජර්නලය (රු.'000)**

| දිනය | විස්තරය | වටිනාකම | විකුණුම් | VAT |
|---|---|---|---|---|
| 2026.01.12 | කුමුදු ට්‍රේඩර්ස් | 1 062 | 900 | 162 |
| 2026.01.20 | සංඛ ට්‍රේඩර්ස් | 708 | 600 | 108 |
| **එකතුව** | | **1 770** | **1 500** | **270** |

- අජන්තා ට්‍රේඩර්ස් විසින් සිය වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල පියවීම සඳහා විකුණුම් දින සිට දින 30 ක ණය කාලයක් ලබාදෙන අතර දින 15 ක් ඇතුළත සම්පූර්ණ මුදල පියවන්නේ නම් 10% ක වට්ටමක් දෙනු ලැබේ.
- කුමුදු ට්‍රේඩර්ස් වෙතින් ලැබිය යුතු මුළු මුදල 2026.01.22 දින ලැබුණි. සංඛ ට්‍රේඩර්ස් විසින් ගෙවිය යුතු මුදල සමාන වාරික දෙකකින් පියවීමට එකඟ වූ අතර 2026.01.30 දින ප්‍රථම වාරිකය ලැබුණි.

(v) 2026 ජනවාරි මාසයේ අත්පිට ගැනුම් සහ අත්පිට විකුණුම්:

| | වටිනාකම (රු.'000) |
|---|---|
| 2026.01.25 දින අත්පිට ගැනුම් (රු. 54 000 ක VAT ඇතුළත්ව) | 354 |
| 2026.01.28 දින අත්පිට විකුණුම් (රු. 72 000 ක VAT ඇතුළත්ව) | 472 |

(vi) 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් රු. 520 000 ක් විය. දේපළ, පිරියත සහ උපකරණ මත මාසික ක්ෂය රු. 50 000 ක් ද මෙහි ඇතුළත් වේ. ඉතිරිය මුදලින් ගෙවන ලදී.

**අවශ්‍යවන්නේ:**

(1) 2026 ජනවාරි මාසය සඳහා පහත මූලික සටහන් පොත්:
(i) මුදල් ලැබීම් ජර්නලය (ii) මුදල් ගෙවීම් ජර්නලය

(2) මුදල් ලැබීම් ජර්නලයේ සහ මුදල් ගෙවීම් ජර්නලයේ එකතුන් පොදු ලෙජරයට පිටපත් කිරීමේ ජර්නල් සටහන් (සංලක්ෂ්‍යය අවශ්‍ය වේ)

(3) 2026 ජනවාරි මාසය සඳහා පොදු ලෙජරයේ පහත ගිණුම්:
(i) මුදල් ගිණුම (ii) විකුණුම් ගිණුම
(iii) ගැනුම් ගිණුම (iv) VAT පාලන ගිණුම

(4) 2026.01.31 දිනට තොගයේ පිරිවැය සහ 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා දළ ලාභය

**(ලකුණු 25 යි)**

(ආ) සීමිත මල්කි පොදු සමාගම එහි මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමට නව යන්ත්‍රයක් මිලට ගැනීමේ ව්‍යාපෘතියක් සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රයෙහි පිරිවැය රු. 28 000 000 ක් වේ. මෙම යන්ත්‍රයෙහි ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 3 000 000 ක් වේ. තවද රු. 4 000 000 ක කාරක ප්‍රාග්ධනයක් ව්‍යාපෘතිය ආරම්භයේදී අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතියේ අවසාන වර්ෂයේදී ආවරණය කරගැනීමට අපේක්ෂා කරයි.

මෙම ව්‍යාපෘතියට අදාළ තොරතුරු පහත පරිදි වේ:

(i) වර්ෂ 1 සහ 2 සඳහා අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය වර්ෂයකට ඒකක 4 500 බැගින් වේ. වාර්ෂික නිෂ්පාදනය 3 වන වර්ෂයේදී 20% කින් වැඩි වී ව්‍යාපෘතිය අවසානය තෙක් එම මට්ටමේම පවතිනු ඇතැයි අපේක්ෂා කරයි. ව්‍යාපෘති කාලසීමාව තුළදී ඒකකයක විකුණුම් මිල රු. 6 000 ක් වනු ඇත. වර්ෂයක් තුළදී නිපදවනු ලබන සියලුම ඒකක එම වර්ෂයේදීම විකිණීමට අපේක්ෂා කෙරේ.

(ii) පළමු වර්ෂ තුන සඳහා සෘජු නිෂ්පාදන පිරිවැය ඒකකයක් සඳහා රු. 3 000 ක් වනු ඇත. ඉන්පසුව එය ඒකකයකට රු. 3 300 දක්වා වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(iii) ක්ෂයවීම් ඇතුළත්ව ව්‍යාපෘතියේ වාර්ෂික නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 6 800 000 ක් ලෙස ඇස්තමේන්තු කෙරේ. යන්ත්‍රය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(iv) තුන්වන පාර්ශ්වයකට කුලියට ලබා දී තිබෙන සමාගමේ ගොඩනැගිල්ලක් තුළ මෙම යන්ත්‍රය ස්ථානගත කිරීමට අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස සෑම වර්ෂයකම රු. 1 000 000 ක් බැගින් කුලී ආදායමක් ව්‍යාපාරයට අහිමි වනු ඇත.

(v) මෙම ව්‍යාපෘතිය ආදායම් බදුවලින් නිදහස් වේ.

(vi) ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% වන අතර එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය (*ආසන්න දශම ස්ථාන දෙකකට*) | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මූලික සහ වාර්ෂික මුදල් ගලාඒම් සහ ගලායාම් (*එක් එක් මුදල් ප්‍රවාහ අයිතමය වෙන වෙනම දක්වමින්*)

(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV)

(3) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව ව්‍යාපෘතියේ ආයෝජනය කිරීම සඳහා නිර්දේශය

(4) ව්‍යාපෘතියේ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (*සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව*) **(ලකුණු 15 යි)**

**(මුළු ලකුණු 40 යි)**

5. (අ) වෙළෙඳ සමාගමක් වන සීමිත දයාන් පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| **2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | **(රු.'000)** |
|---|---|
| විකුණුම් | 6 400 |
| විකුණුම් පිරිවැය | 3 840 |
| වෙනත් ආදායම් | 80 |
| පරිපාලන, විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | 990 |
| මූල්‍ය පිරිවැය | 110 |
| ආදායම් බදු වියදම | 420 |
| **වර්ෂය සඳහා ලාභය** | **1 120** |

| **2026.03.31 දිනට:** | **(රු.'000)** |
|---|---|
| ජංගම නොවන වත්කම් | 5 250 |
| ජංගම වත්කම් | 3 750 |
| **මුළු වත්කම්** | **9 000** |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 2 800 |
| රඳවාගත් ඉපැයුම් | 2 200 |
| ජංගම නොවන වගකීම් - බැංකු ණය | 1 500 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 1 750 |
| උපචිත වියදම් | 750 |
| **මුළු වගකීම් සහ හිමිකම** | **9 000** |

**අතිරේක තොරතුරු:**

2026.03.31 දිනට සාමාන්‍ය කොටස් 28 000 ක් නිකුත් කර තිබූ අතර වර්ෂය තුළදී රු. 280 000 ක ලාභාංශයක් ගෙවන ලදී.

**අවශ්‍යවන්නේ:**

2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත අනුපාත:

(1) දළ ලාභ අනුපාතය
(2) ශුද්ධ ලාභ අනුපාතය
(3) කොටසක ඉපැයුම
(4) කොටසක ලාභාංශය
(5) ණය හිමිකම් අනුපාතය
(6) ජංගම අනුපාතය
(7) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

**(ලකුණු 10 යි)**

**(ආ)** වෛද්‍යවරුන් වන ජබීර්, කබීර් සහ සමීර් හවුල් ව්‍යාපාරයක අයිතිකරුවන් වන අතර එම හවුල් ව්‍යාපාරය පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යනු ලබයි. හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- ජබීර්, කබීර් සහ සමීර් අතර පිළිවෙළින් 3:2:1 අනුපාතයට ලාභාලාභ බෙදාගනු ලබයි.
- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත වාර්ෂිකව 10% ක පොලියක් ලැබීමට හවුල්කරුවන් හිමිකම් ලබයි.
- හවුල් ව්‍යාපාරයේ කළමනාකාරිත්වයට සහභාගී වීම වෙනුවෙන් සෑම හවුල්කරුවෙකුම රු. 2 400 000 බැගින් වාර්ෂික වේතනයක් ලැබීමට හිමිකම් ලබයි.
- මෙම ගිවිසුමෙන් ආවරණය නොවන කරුණු සඳහා 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ විධිවිධාන භාවිත කරනු ලබයි.

පුහුණු වන ගිණුම් සහයකයකු විසින් පිළියෙල කරන ලද 2026.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| 2025.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| ජබීර් | | 7 000 |
| කබීර් | | 5 000 |
| සමීර් | | 4 000 |
| 2025.04.01 දිනට ජංගම ගිණුම්: | | |
| ජබීර් | | 1 000 |
| කබීර් | | 400 |
| සමීර් | 200 | |
| 2025.04.01 දින ජබීර් ලබාදුන් ණය මුදල | | 2 000 |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 24 000 | |
| කාර්යාල උපකරණ | 500 | |
| රෝහල් සේවාවලින් අයභාරය | | 45 000 |
| වෙනත් ආදායම් | | 1 200 |
| රෝහල් සේවා ලබාදීමේ පිරිවැය | 15 000 | |
| පරිපාලන වියදම් | 16 400 | |
| අලෙවිකරණ වියදම් | 4 500 | |
| ගෙවූ ආදායම් බදු | 100 | |
| බැංකු අයිරාව | | 3 100 |
| 2026.03.31 දිනට තොගය - පිරිවැයට | 6 200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 2 300 | |
| අවිනිශ්චිත ගිණුම | | 500 |
| | **69 200** | **69 200** |

**අතිරේක තොරතුරු:**

(i) සෑම හවුල්කරුවෙකුටම ප්‍රවර්තන වර්ෂය තුළදී රු. 2 000 000 බැගින් මුදලින් වැටුප් ගෙවා ඇති අතර මෙම මුදල වැරදීමකින් පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇත.

(ii) රෝහල් සේවා ලබාදීමේ පිරිවැය ගණනය කිරීමේදී සැලකිල්ලට ගත් අවසාන තොගයේ පිරිවැය වූ රු. 6 200 000 ගබඩා ලෙජරයෙන් ලබාගෙන ඇත. ජබීර් විසින් තම පෞද්ගලික භාවිතය සඳහා ව්‍යාපාරයෙන් ලබාගත් රු. 1 200 000 ක අයිතම ගබඩා ලෙජරයෙහි ගළපා නොතිබුණි. භෞතික තොගය මත ආගණනය කරන ලද 2026.03.31 දිනට තොගයේ පිරිවැය රු. 5 000 000 ක් විය.

(iii) කබීර්ගේ පවුලේ සාමාජිකයෙකු මාසයක කාලයක් මෙම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගෙන තිබීම වෙනුවෙන් මුළු ගාස්තුව රු. 400 000 ක් විය. මෙම ගාස්තුව පියවීම සඳහා රු. 300 000 ක් ගෙවීමට කබීර් එකඟ වූ අතර අනෙකුත් හවුල්කරුවන්ගේ එකඟතාවය මත ඉතිරි මුදල රෝගියාට දුන් වට්ටමක් ලෙස සලකන ලදී. කෙසේ වුවද මෙම කිසිදු ගනුදෙනුවක් ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. හවුල් ව්‍යාපාරය විසින් ගනුදෙනුකරුවන්ට ලබාදෙන වට්ටම් අලෙවිකරණ වියදමක් ලෙස සලකනු ලබයි.

(iv) 2026 මාර්තු මාසය තුළදී කබීර් විසින් පරීක්ෂා කරන ලද රෝගීන්ගෙන් අයකරන ලද රු. 200 000 ක් වැරදීමකින් හවුල් ව්‍යාපාරයේ වෙනත් ආදායමක් ලෙස සටහන් කර තිබුණි. අනෙක් හවුල්කරුවන් හා එකඟ වූ පරිදි මෙම වටිනාකමින් 75% ක් කබීර්ගේ පෞද්ගලික ආදායමක් ලෙස සැලකිය යුතු අතර ඉතිරි 25% හවුල් ව්‍යාපාරයේ අයභාරය ලෙස සැලකිය යුතු වේ.

(v) ශේෂ පිරික්සුමේ දක්වා ඇති ආදායම් බදු ගෙවීම වූ රු. 100 000 මගින් නිරූපණය කරනු ලබන්නේ හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලද සමීර්ගේ පෞද්ගලික ආදායම් බද්දයි.

(vi) ශේෂ පිරික්සුමේ දක්වා ඇති කාර්යාල උපකරණ 2025.04.01 දින ජබීර්ගේ පෞද්ගලික අරමුදල්වලින් ව්‍යාපාරය සඳහා මිල දී ගෙන ඇත. මෙම උපකරණවල පිරිවැය කාර්යාල උපකරණ ගිණුමට හර කර අවිනිශ්චිත ගිණුමකට බැර කර ඇත. ප්‍රවර්තන වර්ෂය සඳහා මෙම උපකරණවල ක්ෂය රු. 50 000 ක් වන අතර එය මෙතෙක් ගිණුම්ගත කර නොමැත. හවුල් ව්‍යාපාරය විසින් දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය පරිපාලන වියදම් ලෙස සලකනු ලබයි.

(vii) 2026.03.31 දින සමීර් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලද අතර මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 3 000 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. ඉන් පසුව ජබීර් සහ කබීර් පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය. තවද, මෙදිනට හවුල් ව්‍යාපාරයෙන් ඔහුට ලැබිය යුතු මුළු මුදල ව්‍යාපාරයට ලබාදුන් ණයක් ලෙස සැලකීමට සමීර් එකඟ විය.

**අවශ්‍යවන්නේ:**

(1) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (*හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන්ද ඇතුළුව*)

(2) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

(3) 2026.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

***(ලකුණු 30 යි)***
***(මුළු ලකුණු 40 යි)***

6\. **(අ)** සීමිත අමාලි පොදු සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

| | **2026.03.31 දිනට (රු.'000)** | **2025.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 30 500 | 26 800 |
| තොගය | 2 500 | 3 500 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 12 500 | 11 250 |
| කලින් ගෙවූ මෙහෙයුම් වියදම් | 1 500 | 1 000 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 2 000 | 600 |
| **මුළු වත්කම්** | **49 000** | **43 150** |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 25 000 | 17 500 |
| රඳවාගත් ඉපැයුම් | 15 000 | 12 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 7 500 | 11 750 |
| ගෙවිය යුතු ආදායම් බදු | 800 | 1 400 |
| උපචිත මෙහෙයුම් වියදම් | 700 | 500 |
| **මුළු වගකීම් සහ හිමිකම** | **49 000** | **43 150** |

**අතිරේක තොරතුරු:**

(i) සමාගමේ සියලු විකුණුම් සහ ගැනුම් ණය පදනමට සිදු කරයි.

(ii) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විකුණුම් රු. 43 500 000 ක් විය.

(iii) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු මෙහෙයුම් වියදම් සහ ආදායම් බදු වියදම පිළිවෙළින් රු. 9 250 000 ක් සහ රු. 1 500 000 ක් විය. දේපළ, පිරියත සහ උපකරණ මත ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය රු. 3 500 000 ක් මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් වේ. තවද, 2026.03.31 දින ප්‍රථම වරට සිදු කරන ලද දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය තුළින් රු. 3 000 000 ක හිඟයක් ඇති වූ අතර එයද මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් කර ඇත.

(iv) ධාරණ වටිනාකම රු. 1 750 000 ක් වූ කාර්යාල උපකරණ රු. 2 600 000 කට විකුණන ලදී. මෙම කාර්යාල උපකරණ විකිණීමෙන් ඇති වූ ලාභය වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන ඇත. ප්‍රවර්තන වර්ෂය සඳහා වෙනත් ආදායම් තුළ ඇති එකම අයිතමය මෙම ලාභය පමණි. තවද, ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් මෝටර් රථයක් අත්පිට මුදලට මිල දී ගන්නා ලදී.

(v) ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් රඳවාගත් ඉපැයුම් රු. 2 500 000 ක් ප්‍රාග්ධනිත කරන ලදී. තවද ප්‍රවර්තන වර්ෂය තුළදී සමාගම විසින් ප්‍රසිද්ධ කොටස් නිකුතුවක්ද සිදු කරන ලද අතර කොටස් නිකුතුවේ මුළු වටිනාකම සඳහාම මුදල් එකතු කර ගන්නා ලදී.

(vi) 2026.01.01 දින රු. 2 000 000 ක අතුරු ලාභාංශයක් සමාගම විසින් ගෙවන ලදී.

(vii) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ අනුපාතය 40% ක් විය.

**අවශ්‍යවන්නේ:**

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අමාලි පොදු සමාගමෙහි පහත දෑ:

(1) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (*මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ මුදල් ප්‍රවාහ පෙන්නුම් කිරීමේදී* ***වක්‍ර ක්‍රමය*** *භාවිත කරන්න*).

(2) ***සෘජු ක්‍රමය*** භාවිත කරමින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇතිවූ මුදල් ප්‍රවාහ.

***(ලකුණු 20 යි)***

[දහවැනි පිටුව බලන්න.

**(ආ)** යාපනයේ පිහිටි ප්‍රජා මධ්‍යස්ථානයක් එහි 75 වන සංවත්සරය 2027 ජනවාරි මාසයේදී සැමරීමට සැලසුම් කරයි. මෙම ප්‍රජා මධ්‍යස්ථානයෙහි මුළු සාමාජික සංඛ්‍යාව 150 ක් වේ. මෙම සංවත්සරය සැමරීම සඳහා ප්‍රජා මධ්‍යස්ථානය විසින් ක්‍රීඩා උත්සවයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරයි.

(i) ක්‍රීඩා උත්සවය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය:

| | | රු. |
|---|---|---|
| විශේෂිත ආරාධිත අමුත්තන් 8 දෙනෙකු සඳහා මල් මාලා | මල්මාලාවකට | 1 500 |
| විශේෂිත ආරාධිත අමුත්තන් 8 කට සංග්‍රහ වියදම් | ආරාධිතයෙකු සඳහා | 1 000 |
| පුටු කුලියට ගැනීමේ පිරිවැය | පුටුවක් සඳහා | 600 |
| ක්‍රීඩා උත්සවයේ ජයග්‍රාහකයන්ට ත්‍යාග | | 50 000 |
| ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට ගැනීමේ පිරිවැය | | 44 000 |
| සමරු තිළිණයක පිරිවැය | | 2 000 |
| සාමාජිකයකු සඳහා ආහාර පැකට්ටුවක පිරිවැය | | 850 |
| සාමාජිකයකු සඳහා වතුර බෝතලයක පිරිවැය | | 150 |

(ii) සෑම විශේෂිත ආරාධිත අමුත්තෙකුටම සහ ක්‍රීඩා උත්සවයට සහභාගි වන සෑම සාමාජිකයකුටම සමරු තිළිණය බැගින් පිරිනමනු ලබයි.

(iii) මෙම උත්සවය සඳහා පුටු 160 ක් කුලියට ගැනීමට තීරණය කර ඇත.

(iv) ක්‍රීඩා උත්සවයට සහභාගි වන සෑම සාමාජිකයකුගෙන්ම රු. 5 000 ක ගාස්තුවක් අයකිරීමට අපේක්ෂා කෙරේ.

**අවශ්‍යවන්නේ:**

(1) ක්‍රීඩා උත්සවයේ මුළු ස්ථාවර පිරිවැය

(2) සාමාජිකයකු සඳහා විචල්‍ය පිරිවැය

(3) සාමාජිකයකු සඳහා දායකය

(4) ක්‍රීඩා උත්සවයේ මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා සහභාගි විය යුතු සාමාජිකයන් ගණන

(5) ක්‍රීඩා උත්සවයෙන් රු. 50 000 ක අතිරික්තයක් අපේක්ෂා කරන්නේ නම් ක්‍රීඩා උත්සවයට සහභාගි විය යුතු සාමාජිකයන් සංඛ්‍යාව

(6) ක්‍රීඩා උත්සවය සඳහා සාමාජිකයන් 100 දෙනෙක් සහභාගි වන්නේ නම් මුළු පිරිවැය ආවරණය කරගැනීම සඳහා සාමාජිකයකුගෙන් අය කළ යුතු ගාස්තුව

(7) ක්‍රීඩා උත්සවයට සාමාජිකයන් 150 දෙනාම සහභාගිවන්නේ නම් සහ සාමාජිකයකුගෙන් රු. 5 500 බැගින් අය කරන්නේ නම් අපේක්ෂිත අතිරික්තය

(8) ක්‍රීඩා උත්සවය සඳහා සාමාජිකයන් 100 දෙනෙකු සහභාගි වන්නේ නම් සහ සමරු තිළිණයක පිරිවැය රු. 1 750 ක් දක්වා අඩු කළ හැකි නම් මුළු පිරිවැය ආවරණය කර ගැනීම සඳහා සාමාජිකයකුගෙන් අය කළ යුතු ගාස්තුව

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

* * *

Past Papers Wiki

PAST PAPERS WIKI

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers WiKi

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library
0001788